දේශීය ණය සහ සංවර්ධන අරමුදල

உள்ளூர் கடன்கள் மற்றும் அபிவிருத்தி நிதியம்

LOCAL LOANS AND DEVELOPMENT FUND

2022

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்கும்

ANNUAL REPORT AND ACCOUNTS

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government



දේශීය ණය සහ සංවර්ධන අරමුදල

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2022

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය

පටුන

		පිටුව
1.	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ සහ අරමුදල්	04
2.	ආයතනික තොරතුරු	04
3.	කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය	06
4.	ඒකාබද්ධ පාලන ක්‍රියාවළිය	07
5.	ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති	10
6.	මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය	12
7.	විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	25

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

8.	විගණකාධිපති වාර්තාව	30
9.	විස්තීරණ ආදායම් ප්‍රකාශනය	37
10.	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය	38
11.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	39
12.	ගිණුම්කරණ සටහන්	41
13.	ගිණුම්කරණ ප්‍රතිපත්ති	64

වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2022

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

01. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ හා අරමුදල්

දැක්ම

පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන ආයතනයක් බවට පත්වීම.

අරමුණ

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

අරමුදල්

ණය ලබා දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් 2009 වර්ෂය දක්වා ලබාගන්නා ලදී. තවද ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) යටතේ ක්‍රියාත්මක වූ නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය සහ ණය අංක 2201 SRI (SF) යටතේ ක්‍රියාත්මක වූ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල් ණය නිකුත් කිරීම සඳහා උපයෝගී කරගනු ලැබේ.

02. ආයතනික තොරතුරු

සංස්ථාපනය

1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කරන ලදුව, 1930 අංක 06, 1931 අංක 25, 1938 අංක 43, 1942 අංක 21 දරණ ආඥා පනත්, සහ 1949 අංක 29 දරණ පනත, 1974 අංක 09 දරණ නීතිය සහ 1993 අංක 24 දරණ පනත යන පනත් වලින් සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන අරමුදල ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2020 වර්ෂයේ සිට මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර, 2022 වර්ෂයේ සිට පළාත් සභා හා පළාත් පාලන විෂය අයත්වූ අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

කාර්යභාරය

ශ්‍රී ලංකාව තුල මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ලෙස සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 341 න් 340 ක් (කොළඹ මහ නගර සභාව හැර) සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.

ලියාපදිංචි ස්ථානය	**නො. 24/A, වෝඩ් පෙදෙස, කොළඹ 07**
දුරකථනය	011-2687514
ෆැක්ස්	011-2691261
විද්‍යුත් තැපැල්	lldf1916@gmail.com

විගණකවරු : විගණකාධිපති දෙපාර්තමේන්තුව

අභ්‍යන්තර විගණනය : අභ්‍යන්තර විගණන අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය (පළාත් සභා සහ පළාත් පාලන අංශය)

බැංකුකරුවෝ : ලංකා බැංකුව

කාර්ය මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

තනතුර	2022.12.31 දිනට සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන)	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)	01
සහකාර ගණකාධිකාරී	01
පරිපාලන නිලධාරී	01
සංවර්ධන නිලධාරී	18
කළමනාකරණ සහකාර	07
රියදුරු	02
කාර්යාල කාර්ය සහායක	01
එකතුව	**33**

03. කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය

1993 අංක 24 දරණ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධිත) පනතේ 2 වගන්තිය ප්‍රකාර කොමසාරිස් මණ්ඩලය ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාපති - විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්.
(ආ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් අයෙකු.
(ඇ) එක් එක් පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 09 දෙනෙකු.
(ඈ) ගරු අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

2022.12.31 දිනට කොමසාරිස් මණ්ඩලය

සභාපති

01. එම්.එම්.පී.කේ.මායාදුන්න මහතා	- ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

භාණ්ඩාගාර නියෝජනය

02. ඩබ්.ජී.කේ.එල්.චන්ද්‍රසේකර මහත්මිය	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

සාමාජිකයින්

03	ගාමිණී රාජරත්න මහතා	ප්‍රධාන ලේකම්	(මධ්‍යම පළාත)
04	සී.ජේ.එම්.ජී.සී.බණ්ඩාර මහතා	ප්‍රධාන ලේකම්	(උතුරු මැද පළාත)
05	පී.බී.විජයරත්න මහතා	ප්‍රධාන ලේකම්	(ඌව පළාත)
06	සුනිල් ජයලත් මහතා	ප්‍රධාන ලේකම්	(සබරගමුව පළාත)
07	ආර්.එම්.පී.එස්.රත්නායක මහතා	ප්‍රධාන ලේකම්	(නැගෙනහිර පළාත)
08	පී.බී.එම්.සිරිසේන මහතා	ප්‍රධාන ලේකම්	(වයඹ පළාත)
09	ජයන්ති විජේතුංග මහත්මිය	ප්‍රධාන ලේකම්	(බස්නාහිර පළාත)
10	එස්.කුගතාස් මහතා	නියෝජ්‍ය ප්‍රධාන ලේකම්	(උතුරු පළාත)
11	රනිල් වික්‍රමසේකර මහතා	පළාත් පාලන කොමසාරිස්	(දකුණු පළාත)
12	කේ.පී.එල්.ඒ.කාරියවසම් මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	
13	තෙන්නකෝන් රුසිරුපාල මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	
14	ඒ.බී.හේරත් මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	

04. ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය

ආයතනයේ පාලන ක්‍රියාවලිය කොමසාරිස් මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන සංයුක්ත ක්‍රියාවලියක් වශයෙන් හැඳින්විය හැකිය. පාලන ක්‍රමයක වැදගත්ම අංගය වන මෙය ආයතනයේ ඒකාබද්ධ සාර්ථකත්වය සහ අඛණ්ඩ ආර්ථිකමය පැවත්මට ඉවහල් වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය, ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය පවත්වා ගැනීම මගින් ව්‍යාපාරික ආචාර ධර්ම, පාරදෘශ්‍යතාවය සහ ඉහළ වගකීම් තත්වයන් පවත්වාගැනීම සඳහා බැඳී ඇත.

කොමසාරිස් මණ්ඩලය

සංයුතිය

කොමසාරිස් මණ්ඩලය සභාපති ඇතුළු දාහතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විශේෂිත දැනුම සහ පළපුරුද්ද ආයතනයේ ව්‍යාපාරික ක්‍රියාවලියට උපකාරී වේ. කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් කිසිවකු ආයතනය සමග ගනුදෙනු වලට සම්බන්ධ නොවන අතර, එය ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීමේදී ස්වාධීනත්වය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත.

තීරණ ගැනීම

කොමසාරිස්මණ්ඩල සාමාජිකයින් අවශ්‍යතාවය මත මසකට වරක් රැස්වන අතර එහිදී එදිනෙදා කටයුතු ද විමර්ෂනයට භාජනය කරන අතරම සුවිශේෂ වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ද ගනු ලැබේ. තවද කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් විසින් ආයතනික අරමුණු ලභා කර ගැනීමට අදාළ වන උපාය මාර්ගද තීරණය කරනු ලබයි.

වගකීම

1. ආයතනික ශක්තිය, කාර්යක්ෂමතාව සහ අවදානම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර උපාය මාර්ග සැකසීම.
2. ඉහත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
3. පවතින ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වයට අදාළව අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, ආචාරධර්ම, පවතින නීති සහ ව්‍යවස්ථාවලට අනුකූලතාවය දක්වන බවට වගබලාගැනීම.

චනප්‍රාග්ධන වියදම් නිරීක්ෂණ සහ අභිමන්ත්‍රණය හා සමාලෝචනය.

5. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්සාධනය අධීක්ෂණය.
6. තොරතුරු ක්‍රමවේදය සහ විගණන ක්‍රියාවළිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම.

ස්වාධීන විනිශ්චය

කොමසාරිස් මණ්ඩලයේ ක්‍රියාකාරකම් වලදී සෑම කොමසාරිස්වරයෙකුම තම ස්වාධීන මතය ප්‍රකාශ කළ යුතු අතර, අනෙක් පාර්ශව වල අයුතු බලපෑම් වලට හෝ අගති ගාමී බලපෑම් වලට යටත් නොවිය යුතුය. උපායමාර්ග පිලිබඳ තීරණ ගැනීම, උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, කාර්සාධන සමාලෝචනය, සම්පත් බෙදාහැරීම සහ ව්‍යාපාරික ආචාරධර්ම පවත්වාගෙන යාම ආදී කටයුතු සඳහා කොමසාරිස් වරුන් අවධානය යොමුකළ යුතු වේ.

සභාපති

සභාපතිගේ කාර්යභාරය පැහැදිලිව විස්තර කර වෙන්කර දක්වා ඇති අතර, එමගින් ආයතනය තුල බල තුලනයක් සහතික කිරීමට හැකිවීම නිසා පුද්ගලයන්ගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීමේ ස්වභාවය සීමාවී ඇත.

සභාපතිගේ කාර්යභාරය

කොමසාරිස් මණ්ඩලය වෙත නායකත්වය ලබාදීම සහ උපායමාර්ගික මගපෙන්වීමත් සියළුම ආකාරයේ රැස්වීම් වෘත්තීමය තත්වයෙන් සිදුකරන බවට වගබලා ගැනීමත් සභාපති විසින් කළ යුතුය.

කොමසාරිස් මණ්ඩලය පත්කිරීම

කොමසාරිස් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියා පටිපාටිය ඉතා පැහැදිලි විනිවිද භාවයෙන් යුක්ත වන අතර, එය අදාළ ආඥා පනත අනුව පැහැදිලි කර ඇත.

විගණනය සහ වගකීම

ආයතනික තත්වය සහ අනාගතය ඇගයීම

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව මෙම ආයතනයේ අනාගත දැක්මට අනුව රාජ්‍ය අංශයේ "සී" පංතියේ ආයතනයක් වශයෙන් කටයුතු කරගැනීම සඳහා ආයතනයේ කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකර ඇත.

මනා අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා අවදානම් කළමනාකරණය

කොමසාරිස් වරුන් විසින් ක්‍රියාවට නංවන ලද අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය මගින් ආයතනයේ ආයෝජන සහ වත්කම් සුරක්ෂිත භාවය තහවුරු කර ඇත. තවද අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින ආවේණික අඩුපාඩු හේතුකොටගෙන ඇතිවන වැරදි සහ වංචා සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය දැනුවත් වීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මකව ඇත.

අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධව කලින් කල සිදුකරන විමර්ශන

කොමසාරිස් වරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදුකරන විමර්ෂණ ඇසුරින් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධ නිරීක්ෂණ පාලක මණ්ඩලයට යොමුකරන අතර පාලක මණ්ඩලය මගින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය

පාලක මණ්ඩල කොමසාරිස්වරුන් විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව සකස්කර ඇති බවට සහතික කරන අතර, මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය දැනට පවතින අදාළ නීති සහ ක්‍රියාත්මක භාවයන්ට අනුකූලව සිදු කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇති බවටද සහතික කරයි.

අඛණ්ඩ පැවැත්ම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල නියමිත ද්‍රවශීලතා තත්වයන් යටතේ එහි රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ව්‍යවස්ථාපිත බැඳීම්

කොමසාරිස් වරුන් විසින් ඔවුන්ගේ දැනුම සහ විශ්වාසයට අනුව රජයට ඇති මූල්‍යමය බැඳීම් හා ව්‍යවස්ථාමය වශයෙන් සේවකයන්ට ඇති බැඳීම් සඳහා නියමිත ගෙවීම් කර ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල සලසා ඇති බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වේ.

අනෙකුත් පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවය

සේවකයන්

පාලක මණ්ඩලය විසින් සම්පාදිත ආයතනයේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ සම්බන්ධව ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් වී ඇත. අවම වයස් සීමාවට අඩු කිසිම පුද්ගලයෙකුට ආයතනයේ රැකියා අවස්ථා සලසා නොමැත. ආයතනයේ රැකියා අවස්ථා සහ උසස්වීම් සඳහා ජාතිය, ලිංගභේදය ආදී වෙනස්කම් සැලකිල්ලට භාජනය නොකෙරේ.

නියාමන ආයතන

මහා භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සම්බන්ධව පාලක මණ්ඩලය සහතික වී ඇත. ආයතනයේ පැවැත්ම සහ ක්‍රියාකාරීත්වය අදාළ ආයතන මගින් නිකුත් කරන නීති සහ නියෝග නිසි පිලිපැදීම මගින් සහ රටේ පවතින නීතිවලට අනුකූලතාව දැක්වීමෙන් සාක්ෂාත් වී ඇත.

පරිසරය

ආයතනය සහ නිලධාරීන් පිළිගත් සම්මත උපයෝගී කරගැනීම මගින් පරිසර පද්ධතිය මනා ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් විශේෂ සැලකිල්ල යොමු කොට ඇත.

තිරසාර සංවර්ධන අභිමතාර්ථ

2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනත මගින් නීතිගතකර ඇති සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන එම ඉලක්ක සපුරාගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ වැඩපිළිවෙලක් සකස්කොට ඇත.

05. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) - (UDLIHP)
නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ 1998 වර්ෂයේ සිට 2002 දක්වා ක්‍රියාත්මක කරනු ලැබූ ඉහත ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේ ආයතනය වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 27 ක් සඳහා නිකුත්කළ ණය වල වටිනාකම රු.මි.2,270 ක් වේ. මෙම ව්‍යාපෘති අතුරින් **90%** ක ණය අයකිරීම් කරගෙන යනු ලබන අතර ඉතිරි ව්‍යාපෘති වල ණය ආපසු අයකිරීමේ ගැටළු පැන නැගී ඇත. මීට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ අසාර්ථක වීමත් අනෙකුත් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් ද විවිධ ගැටළු පැනනැගී ඇති වීමත්ය.

වගු අංක 5.1 : පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (UDLIHP)
(රු.මි)

වර්ෂය	ණය වාරික අයකිරීම්	පොළී අයකිරීම්
2018	84.5	67.6
2019	96.0	68.1
2020	100.9	62.0
2021	107.8	58.0
2022	112.6	52.8

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) - (LGIIP)
පළාත් පාලන යටතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2006 සිට 2012 දක්වා ක්‍රියාත්මක වූ ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) දරණ පළාත් පාලන යටතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා 2006 ජනවාරි මස ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ නාගරික යටිතල පහසුකම් සහ මූලික නාගරික සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ කාර්යයන් ඇතුලත් වේ. ඒ යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන තිබුණි.

1. ග්‍රාමීය ජල සම්පාදනය
2. පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග සංවර්ධනය
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
4. නාගරික ජලාපවහන සහ මළාපවහන පද්ධතිය සංවර්ධනය
5. කුඩා පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් (මූලික සෞඛ්‍ය සායන හා පුස්තකාල ආදිය)

උක්ත ව්‍යාපෘතිය පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයයෙන් මෙහෙයවූ අතර පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි. මෙය 100% ක ණය මුදලක් වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර, වසර 08ක සහන කාලයක් සමග වසර 32 කින් මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. සහන කාලය තුලදී පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5% කි.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ව්‍යාපෘති සඳහා ණය සහ ප්‍රදාන වශයෙන් කොටස් 02 කි. පළාත් පාලන ආයතන වල වර්ගීකරණය අනුව ණය මුදල 33% සිට 53% දක්වා වන අතර, ප්‍රදානය 40% සිට 60% දක්වා වේ. යටකී ප්‍රදානය දැරිය යුතුව ඇත්තේ ණය සඳහා වන 9% ක පොළී මුදලිනි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඉතා විශාල අවදානමක් දැරිය යුතුව ඇත.

උප ව්‍යාපෘති ශක්‍යතාවය පළාත් පාලන ආයතනවල ඉදිරි ආදායම් මත නිගමනය වේ. මූල්‍ය සහ පළාත් පාලන ක්‍රියාකාරී සැලැස්ම සහ හැකියා වර්ධන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය අංග වන අතර එම අංග ක්‍රියාත්මක වීම මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය අයකරගැනීම සුරක්ෂිතතාවය සහතික වන අතරම, ණය පැහැර හැරීමේ අවදානම අඩුවේ. ඒ අතරම ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදුවීමට පළාත් පාලන ආයතන වල මූල්‍ය තත්වය ශක්තිමත් හා තිරසර විය යුතුය. එමෙන්ම අරමුදලෙන් නැවත ණය ලබාගැනීම සඳහා එකී ශක්‍යතාවය වැදගත්වේ. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුණ ඉහත පරිදි වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත නිකුත්කළ ණය සහ ප්‍රධානයන්ගේ වටිනාකම රු.මි.4,654 ක් වන අතර පළාත් පාලන ආයතන වර්ගය අනුව ණය සහ ප්‍රදාන ලබාදී ඇති ආකාරය පහතින් දැක්වේ.

වගු අංක 5.2 : පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ණය සහ ප්‍රදාන බෙදී ගොස් ඇති ආකාරය (LGIIP)

පළාත් පාලන ආයතන වර්ගය	ණය මුදල	%	ප්‍රදානය	%	එකතුව	%
මහ නගර සභා	254	53	192	40	433	93
නගර සභා	263	43	306	50	543	93
ප්‍රාදේශීය සභා	1,291	33	2,348	60	3,678	93
එකතුව	1,808		2,846		4,654	

වගු අංක 5.3 : පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (LGIIP)

(රු.මි)

වර්ෂය	ණය වාරික අයකිරීම්	පොළී අයකිරීම්
2018	162.9	91.2
2019	181.8	77.5
2020	186.2	62.5
2021	176.6	46.3
2022	134.3	33.6

06. මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය


6.1 මෙහෙයුම් කාර්යසාධනය

2022 වර්ෂයේ කාර්යසාධනය

2022 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.900 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 16 ක් වෙත නිකුත් කළ මුළු ණය වටිනාකම රු.මි.769.8 කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5 -10 කින් ආපසු ගෙවිය යුතුවේ. මෙම වර්ෂය තුලදී පළාත් පාලන ආයතන වෙත ණය නිකුත්කිරීම ප්‍රතිශතයක් ලෙස ගත් කළ 86%කි. ණය වල අවධානම් කළමනාකරණය සිදුකර ගැනීම, ණය ආපසු අයකර ගැනීමේ ක්‍රමවේදය හා ව්‍යාපෘති වල මූල්‍ය ශක්‍යතාවය මත පදනම්ව ණය ලබාදීම සිදුකර ඇත. එම නිසා මෙම වර්ෂය තුලදී ලබාදුන් ණය මුදල් අතුරින් 98%ක් අදායම් උත්පාදක ව්‍යාපෘති වන අතර, 2%ක් සමාජ සුභසාධන ව්‍යාපෘති ලෙස වර්ගීකරණය කළ හැක.

වගු අංක 6.1.1 : 2022 වර්ෂය තුලදී ණය නිකුත් කිරීමේ සාරාංශය

	ව්‍යාපෘති වර්ගය	පොළී ප්‍රතිශතය (වාර්ෂික)	මුදල (රු.)	ව්‍යාපෘති සංඛ්‍යාව
01	පොදු වෙළඳපළ ඉදිකිරීම	12.0%	720,640,749	09
02	ආදාහනාගාර ඉදිකිරීම	6.5%	8,990,000	01
03	කාර්යාල ගොඩනැගිලි සහ මහජන පුස්තකාල ඉදිකිරීම	7.0%	15,534,000	01
04	සූර්ය කෝෂ පද්ධති සවිකිරීම	7.0%	12,900,000	02
05	ගලි බවුසර් මිලදී ගැනීම සඳහා	12.0%	8,600,000	02
06	සම්මන්ත්‍රණ ශාලා ඉදිකිරීම	7.0%	3,200,000	01
	එකතුව		**769,864,749**	**16**




වගු අංක 6.1.2 : දේශීය ණය සහ සංවර්ධන අරමුදල
2022.12.31 දිනට ණය නිකුත් කිරීම (විස්තරාත්මකව)

-	පළාත් පාලන ආයතනය	පළාත	මුදල (රු.)	මලාපවහන කටයුතු සඳහා ගලි බවුසර් මිලදී ගැනීම	සම්මන්ත්‍රණ ශාලා ඉදිකිරීම	සූර්ය කෝෂ පද්ධති	ආදාහනාගාර ඉදිකිරීම	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	කාර්යාල ගොඩනැගිලි සහ මහජන පුස්තකාල ඉදිකිරීම
1	කෑගල්ල ප්‍රා.ස	සබරගමුව	3,231,000	-	-	-	-	3,231,000	-
2	බෙන්තොට ප්‍රා.ස	දකුණු	14,003,897	-	-	-	-	14,003,897	-
3	රත්නපුර ම.න.ස	සබරගමුව	83,844,000	-	-	-	-	83,844,000	-
4	කුරුණෑගල ම.න.ස	වයඹ	332,358,000	-	-	-	-	332,358,000	-
5	පස්බාගෙකෝරළේ ප්‍රා.ස	මධ්‍යම	3,200,000	-	3,200,000	-	-	-	-
6	කැකිරාව ප්‍රා.ස	උතුරු මැද	15,534,000	-	-	-	-	-	15,534,000
7	කොටිකාවත්ත ප්‍රා.ස	බස්නාහිර	8,990,000	-	-	-	8,990,000	-	-
8	කුලියාපිටිය න.ස	වයඹ	222,436,852	-	-	-	-	222,436,852	-
9	පොළොන්නරුව ම.න.ස	උතුරු මැද	24,400,000	-	-	-	-	24,400,000	-
10	පානදුර ප්‍රා.ස	බස්නාහිර	4,231,000	-	-	-	-	4,231,000	-
11	මහරගම න.ස	බස්නාහිර	8,100,000	-	-	8,100,000	-	-	-
12	අයගම ප්‍රා.ස	සබරගමුව	4,960,000	-	-	-	-	4,960,000	-
13	ගලේවෙල ප්‍රා.ස	මධ්‍යම	4,800,000	-	-	4,800,000	-	-	-
14	සූරියවැව ප්‍රා.ස	දකුණු	7,000,000	7,000,000	-	--	-	-	-
15	මස්කෙළිය ප්‍රා.ස	මධ්‍යම	1,600,000	1,600,000	-	-	-	-	-
16	මීගමුව ම.න.ස	බස්නාහිර	31,176,000	-	-	-	-	31,176,000	-
	එකතුව		**769,864,749**	**8,600,000**	**3,200,000**	**12,900,000**	**8,990,000**	**720,640,749**	**15,534,000**

වගු අංක **6.1.3** : **ණය නිකුත් කිරීමේ ප්‍රගතිය - පළාත් අනුව**
2022 වර්ෂය

පළාත	මුදල (රු.)	ප්‍රතිශතය (%)
බස්නාහිර	52,497,000	6.8%
වයඹ	554,794,852	72%
සබරගමුව	92,035,000	12%
දකුණු	21,003,897	03%
උතුරු මැද	39,934,000	05%
මධ්‍යම	9,600,000	01%
එකතුව	**769,864,749**	**100**




රූප සටහන **6.1.3** - පළාත් අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය

වගු අංක 6.1.4 : **ණය නිකුත් කිරීම - 2022 වර්ෂය**

පළාත් පාලන ආයතන වර්ගය අනුව

පළාත් පාලන ආයතන වර්ගය	මුදල (රු.)	ප්‍රතිශතය (%)
මහ නගර සභා	471,778,000	61
නගර සභා	221,966,852	29
ප්‍රාදේශීය සභා	76,119,897	10
එකතුව	**769,864,749**	



රූප සටහන 6.1.4 - පළාත් පාලන ආයතන වර්ගය අනුව ණය නිකුත් කිරීමේ ප්‍රගතිය


ණය ආපසු අයකිරීම

2022 වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ වක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් ණය වාරික වශයෙන් රු.මි.**314.7** ක් ද පොළී මුදල් වශයෙන් රු.මි.**170.6** ක් ද පළාත් පාලන ආයතනයන්ගෙන් ආපසු අයකරගෙන ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය තුලින් රු.මි.**112.6** ණය වාරික වශයෙන් ද රු.මි.**52.8** පොළී වශයෙන් ද අයකරගෙන ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් රු.මි.**3.0** ක් ණය වාරික වශයෙන් ද රු.මි.**3.5** ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.**134.3** ක් වාරික වශයෙන්ද රු.මි.**33.6** ක් පොළී වශයෙන් ද ආපසු අයකරගෙන ඇත.

වගු අංක **6.1.5** : ණය ආපසු අයකිරීමේ ප්‍රගතිය - 2022

(රු.මි)

	වාරික අයකිරීම්	පොළී අයකිරීම්	එකතුව
LLDF	**314.7**	**170.6**	**485.3**
PCDP	**3.0**	**3.5**	**6.5**
UDLIHP	**112.6**	**52.8**	**165.4**
LGIIP	**134.3**	**33.6**	**167.9**
එකතුව	**564.6**	**260.5**	**825.1**




රූප සටහන **6.1.5** - ණය වාරික සහ පොළී මුදල් අයකිරීමේ ප්‍රගතිය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
වගු අංක 6.1.6 : කාර්ය සාධනය 2018 – 2022
(ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති හැර)

(රු.000)

වර්ෂය	නිකුත් කළ ණය	ණය වාරික අයකිරීම්	ණය පොළී අයකිරීම්
2018	403,141	250,880	90,470
2019	652,381	241,004	107,627
2020	614,336	328,177	130,502
2021	847,905	498,813	168,477
2022	769,864	314,784	170,650



රූප සටහන 6.1.6 - කාර්යසාධනය 2018 - 2022

6.2 මූල්‍ය කාර්යසාධනය

ආදායම - 2022 වර්ෂය

වර්ෂය තුල උපයාගන්නා ලද දළ ආදායම රු.මි.**175**කි (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති මගින් නිකුත් කළ ණය මුදල් ද ඇතුළුව). ආයතනයේ පරිපාලන වියදම් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදී ඇති ප්‍රදානයන් වෙන් කිරීමෙන් පසු බදු පෙර ශුද්ධ ලාභය රු.මි.**607.3**කි. (පොත්වලින් ගැලපූ ප්‍රදාන කොටස රුපියල් මිලියන **29.9**කි) තවද 2022 වර්ෂයේ ගණනය කරන ලද ණය හානිකරණයේ අගය රු.මි.**340.8** කි.

වගු අංක 6.2.1 : පසුගිය වර්ෂ 05 ක මූල්‍ය සමාලෝචනය

විස්තරය	2018	2019	2020	2021	2022
ආදායම					
පොළී ආදායම	400,599	266,181	274,899	275,545	289,204
භාණ්ඩාගාර ණය පොළී	(137,858)	(134,813)	(131,744)	126,304	113,769
දළ ආදායම	**262,741**	**131,367**	**143,154**	**149,240**	**175,435**
වෙනත් ආදායම්	3,526	133,929	86,101	63,434	165,600
මුළු මෙහෙයුම් ආදායම	2,221	**265,290**	**229,255**	**212,674**	**341,035**
	264,962				
ණය හානිකරණ අගයන්		4,687	7,646	9,956	(340,829)
ශුද්ධ මෙහෙයුම් ආදායම	4,583	**260,607**	**221,610**	**202,718**	**681,864**
පරිපාලන වියදම්	(40,393)	(41,073)	(38,151)	(40,505)	(44,506)
පළාත් පාලන ආයතන වෙත විශේෂ ප්‍රදාන (Grant Amortization)	**(187,976)**	**(153,588)**	**(115,998)**	**(74,910)**	**(29,997)**
බදු ගෙවීමට පෙර ලාභය	**32,008**	**65,948**	**67,460**	**87,303**	**607,361**
ආදායම් බදු ගෙවීම්	(593)	(3,274)	(2,495)	(16,237)	(36,418)
ශුද්ධ ලාභය	**32,601**	**69,222**	**69,955**	**71,066**	**570,943**
විස්තීරණ ආදායම් ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය	**32,803**	**69,385**	**69,122**	**67,821**	**573,679**
වර්ෂ අවසානයේ මුළු රඳවාගත් ඉපයුම් (හිමිකම)	**(276,095)**	**(176,018)**	**(105,196)**	**(37,315)**	**(220,179)**

රු.000


භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්

2022 වර්ෂය තුලදී දේශීය අරමුදල් සඳහා ණය වාරික සහ පොළී මුදල් වශයෙන් පිළිවෙලින් රු.මි.17.1 ක් සහ රු.මි.5.9 ක් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ රු.මි.126.8 ක් ණය වාරික වශයෙන් ද රු.මි.89.2 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.147.9 ක් ණය වාරික වශයෙන් ද රු.මි.46.5 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි.3.1 ක් ණය වාරික වශයෙන් ද රු.මි.3.5 ක් පොළී වශයෙන් ද ආපසු ගෙවා ඇත.

වගු අංක 6.2.2 : **භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය - 2022**

(රු.මි)

	වාරික ගෙවීම්	පොළී ගෙවීම්	එකතුව
LLDF	17.1	5.9	23.0
PCDP	3.1	3.5	6.6
UDLIHP	126.8	89.3	216.1
LGIIP	147.9	46.5	194.4
එකතුව	**294.9**	**145.2**	**440.1**



රූප සටහන 6.2.2 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය


දේශීය ණය සහ සංවර්ධන අරමුදල

වගු අංක 6.2.3 : මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2018 - 2022

රුපියල් මිලියන

වර්ෂය	වාරික				පොළිය				මුළු එකතුව
	LLDF	PCDP	UDLIHP	LGIIP	LLDF	PCDP	UDLIHP	LGIIP	
2018	21.3	2.13	73.6	20.6	11.9	4.4	64.1	26.3	224.3
2019	21.1	2.3	90.8	80.6	10.3	4.2	76.2	43.9	329.4
2020	20.6	2.5	87.7	121.0	8.8	4.0	78.3	47.4	370.3
2021	18.3	2.8	88.6	146.2	7.2	3.8	66.6	48.5	382.0
2022	17.1	3.1	126.8	147.9	5.9	3.5	89.3	46.5	440.1
එකතුව	98.4	12.83	467.5	516.3	44.1	19.9	374.5	212.6	1746.1


LLDF දේශීය ණය සහ සංවර්ධන අරමුල මගින් නිකුත් කළ ණය
PCDP බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත් කළ ණය මුදල්
UDLIHP නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය



වගු අංක **6.2.4** : **මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්**
දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)
2018 – 2022

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2018	21.3	11.9
2019	21.1	10.3
2020	20.6	8.8
2021	18.3	7.2
2022	17.1	5.9




රූප සටහන **6.2.4** - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (LLDF)

වගු අංක 6.2.5 : **මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්**
2018 – 2022
බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2018	2.13	4.4
2019	2.33	4.2
2020	2.5	4.0
2021	2.8	3.8
2022	3.1	3.5




රූප සටහන 6.2.5 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (PCDP)

වගු අංක 6.2.6 : **මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2018 – 2022**

නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය **(UDLIHP)**

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2018	73.6	64.1
2019	90.8	76.2
2020	87.7	78.3
2021	88.6	66.6
2022	126.8	89.3




රූප සටහන 6.2.6 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (UDLIHP

වගු අංක 6.2.7 : **මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2018 – 2022**
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය **(LGIIP)**

රුපියල් මිලියන

වර්ෂය	වාරික ගෙවීම්	පොළී ගෙවීම්
2018	20.6	26.3
2019	80.6	43.9
2020	121.0	47.4
2021	146.2	48.5
2022	147.9	46.8



රූප සටහන 6.2.7 - මහා භාණ්ඩාගාරයට ණය ආපසු ගෙවීම් (LGIIP)

07. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2022 වර්ෂය

2018 අංක 19 දරණ ජාතික විගනන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු අතර, විගණන හා කළමනාකරණ කමිටුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීමට බැඳේ. 2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පී.ඊ.ඩී./55 ප්‍රකාර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක් සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක ද ඇතුලත් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිත, එහි සභාපති ලෙස ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත නිරීක්ෂක වශයෙන් ද සහභාගී වේ.

(01) 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන

2021 වර්ෂයේ අවසාන ගිණුම් සමාලෝචනය සහ නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කර ඇත.

(02) 2021 වර්ෂයේ සවිස්තරාත්මක **විගණකාධිපති වාර්තාව සමාලෝචනය**

2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව සභාපති වෙත ඉදිරිපත් කරන සවිස්තරාත්මක විගණකාධිපති වාර්තාව සමාලෝචනය කරනු ලැබූ අතර, එමගින් පැන නැගී ඇති කරුණු නිවැරදි කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා ආයතනය යොමුකරනු ලැබීය.

(අ) **ආයතනයේ අධ්‍යක්ෂ තනතුර**

වර්ෂයේ සිට මෙම ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා වැඩ බැලීමේ 2010 පත්කිරීම් දිගින් දිගටම සිදුවන බැවින් අධ්‍යක්ෂ තනතුර සඳහා නිත්‍ය නිලධාරියෙකු බඳවාගැනීමට හැකිවන පරිදි මෙම ආයතනයේ බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට උපදෙස් ලබාදීම.

(ආ) **නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවන පරිදි වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී වෙත වැටුප් හා ප්‍රවාහන දීමනා ගෙවීම**

මෙම ආයතනයේ හිටපු වැඩ බලන අධ්‍යක්ෂ වරයෙකු වූ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු වන එස්.ඒ.එන්.ආර්.සුභසිංහ මහතා විසින් නීතිරීති හා රෙගුලාසිසි වලට පටහැනිව වර්ෂවල 2016 – 2015 දී ලබා ගෙන ඇති වැටුප් සහ ප්‍රවාහන දීමනාව අය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට උපදෙස් ලබාදීම.

(03) 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව

2021 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය මගපෙන්වීම සහ උපදෙස් ලබාදීම.

(04) ව්‍යවස්ථා, කොන්දේසි, නීතිරීති හා චක්‍ර ලේඛන සමග අනුකූලතාවය

ඒකාබද්ධ සැලසුම පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබාදුන් අතර 2023 වර්ෂයේ මූල්‍යමය බලතල මු.රෙ.135 යටතේ පැවරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බවට උපදෙස් දෙන ලදී.

(05) පද්ධති සහ පාලන ක්‍රම ඵලදායීතාවය

අයවැය ලේඛන, පාලන පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට පාලන අධිකාරියට උපදෙස් ලබාදෙන ලදී. එමෙන්ම ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කර අදාළ පියවර ගැනීමට ප්‍රධාන විධායක නිලධාරීට උපදෙස් දෙන ලදී.

(06) බඳවාගැනීමේ සහ උසස්වීම් පටිපාටිය සංශෝධනය කිරීම

මෙම ආයතනයේ බඳවාගැනීම් සහ උසස්කිරීම් පටිපාටිය සංශෝධනය කර අදාළ අනුමැතීන් කඩිනමින් ලබාගැනීමට අවශ්‍ය මගපෙන්වීම සහ උපදෙස් ලබාදීම.

(07) හිඟ ණය අයකිරීම

අක්‍රිය තත්වයේ පවතින ණය මුදල් අයකිරීම සඳහා පළාත් පාලන ආයතන සමග සාකච්ඡාකර එම ආයතන වලට ගෙවීමට හැකි වාරික මුදලකට ණය මුදල ප්‍රතිව්‍යුහගතකර අයකිරීමටත්, පළාත් මට්ටමින් යොමුකර ඒ සඳහා ප්‍රමුඛත්වය ලබාදී සාකච්ඡා කිරීමත් නැතහොත් නීතිමය පියවර ගැනීම සඳහා කොමසාරිස් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නිර්දේශ කර ඇත.

(08) පරිගණක මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාම සඳහා Server පහසුකම ලබාගැනීම

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය තොරතුරු කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යනු ලැබූ Server යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බැවින්, ඒ සඳහා Server පහසුකම ලබාගැනීමට පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂනයක් සිදුකර කඩිනමින් වඩාත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය මගපෙන්වීම සහ උපදෙස් ලබාදීම.

(09) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් - 2022

විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව සාකච්ඡාකර අදාළ නිවැරදි කිරීම් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

(10) තිරසාර සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන පනත මගින් ප්‍රධාන අරමුණු 17 ක් හඳුනාගෙන ඇති බවත්, ඒවායින් ආයතනයට වඩා වාසිදායක අරමුණු හඳුනාගෙන එම අරමුණු වලට ලභාවීම සඳහා ආයතනයේ මුළු සේවක සංඛ්‍යාව සඳහා KPI සකස් කර, අදාළ ඇගයීමේ ක්‍රමවේදය සකස් විය යුතු බව පෙන්වා දීම.

2022 වර්ෂයේ කමිටු සාමාජිකයින්

ඩබ්.ජී.කේ.එල්.චන්ද්‍රසේකර මහත්මිය	භාණ්ඩාගාර නියෝජනය	සභාපති
ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය	ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත	සාමාජික
ඒ.බී.හේරත් මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද කොමසාරිස් මණ්ඩල සාමාජික	සාමාජික
ඒ. ධනපාල මහතා	ජාතික විගණන කාර්යාලය	නිරීක්ෂක
පී.වල්ලි මහත්මිය	ප්‍රධාන අභ්‍යන්තර විගණක රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (පළාත් සභා හා පළාත් පාලන අංශය)	කැඳවුම්කරු

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. පිඒඑල්/ඩී/එල්එල්ඩීඑල්/01/22/04

මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 අගෝස්තු 17 දින

සභාපති,

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

22 AUG 2023

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් - 1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. පිඒඑන්/ඩී/එල්එල්ඩීඑන්/01/22/04

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 අගෝස්තු 17 දින

සභාපති,
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම්

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ණය සහ ලැබිය යුතු ශේෂවලට අදාළ ලෙජර ගිණුම් හා ණය කළමනාකරණ මෘදුකාංගයේ ශේෂයන් තුළ ඇතුලත් ප්‍රාග්ධන වටිනාකමෙහි රු.19,496,245ක සහ අවිනිශ්චිත පොලි වටිනාකමෙහි රු.204,527,895ක වෙනසක් විය.

(ආ) ලෙජර ගිණුම් අනුව රු. 709,251,218ක් වූ අවිනිශ්චිත පොලි වටිනාකම් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොනිබුණි. ඒ හේතුවෙන් ලෙජරයේ දැක්වෙන ශේෂ සමග පළාත් පාලන ආයතන විසින් තහවුරු කරන ලද ශේෂ සැසඳිය නොහැකි විය.

තවද ණය කළමනාකරණ මෘදුකාංගයේ දෝෂයක් හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 04කට අදාළව මෘදුකාංගයේ දැක්වෙන ශේෂයන් සහ එම මෘදුකාංගය විසින්ම ජනනය කරනු ලබන ණය ශේෂ තහවුරු කිරීමේ ලිපිවල දක්වා ඇති ශේෂ අතර රු. 333,519,852ක වෙනසක් වූ අතර පළාත් පාලන ආයතන විසින් එවන ලද ණය ගැනි ශේෂ තහවුරු කිරීම් සහ මෘදුකාංගයේ ශේෂ අතර රු. 22,126,145ක වෙනසක් විය.

(ඇ) පොලී ආදායම්, ණය හා ලැබිය යුතු සහ කලින් ලද ණය හා අන්තිකාරම් සඳහා වූ ලෙජර ගිණුම් ශේෂයන් සහ ඊට අදාළව ඉදිරිපත් කරන ලද උපලේඛනවල සඳහන් වටිනාකම් අතර පිළිවෙලින් රු.320,960, රු.5,241,939 හා රු.345,741ක වෙනස්කම් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණය හානිකරණය ගැළපීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09ට අනුව ආයතනයට අනන්‍ය වූ ආකෘතියක් ගොඩනගාගෙන නොනිබුණු අතර ලාභ අරමුණු කර ගත් මූල්‍ය ආයතනයක ආකෘතියක් භාවිතා කර නිබුණි. තවද, හානිකරණ අගය ගණනය කිරීම සඳහා භාවිතා කරන ලද ආකෘතියට දත්ත ඇතුළත් කිරීමේදී හානිකරණය සඳහා විශේෂයෙන් සිදු කළ යුතු ඒකල ණයගැනි වයස් විශ්ලේෂණයක් සිදු කර නොනිබුණි.

(ඉ) හානිකරණ අගය ගණනය කිරීම සඳහා ලෙජර ගිණුම්වල ශේෂ යොදාගෙන නිබුණ ද ඉහත (අ), (ආ) සහ (ඇ) කරුණුවලට අනුව එම ශේෂවල නිරවද්‍යතාවය තහවුරු නොවන බැවින් රු.1,333,047,846ක් වූ හානිකරණය සඳහා වෙන් කිරීම් සහ රු. 340,829,524ක් වූ හානිකරණ ලාභයෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැකි විය.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 22 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්තියක වෙනස්වීම් අතීතානුයෝගීව ව්‍යවහාර කළ විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය ඉදිරිපත් කළ යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි කරන ලද අගයන් දැක්වෙන සන්සන්දනාත්මක විටිනාකම් ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන වලට අනුව පසුගිය වර්ෂයේදී දක්වා තිබූ රු.87,303,108ක බදු පෙර ලාභය රු.661,570,406ක අලාභයක් ලෙසත් රු.3,454,569,841ක ණය හා ලැබිය යුතු ශේෂය රු.2,731,739,987ක් ලෙසත් සන්සන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය නොකෙරුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 34 ඡේදය ප්‍රකාරව භාවිතා නොකරන ලද ඉදිරියට ගෙනා බදු අලාභය සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගත යුතු වුවද ඒ වෙනුවට වර්ෂයේ ලාභය හඳුනාගෙන සියයට 24 වෙනුවට සියයට 10 අනුපාතය යොදාගෙන විලම්භිත බදු වත්කම් ගණනය කර තිබූ බැවින් ඉදිරියට ගෙනා බදු අලාභය මත විලම්භිත බදු වත්කම් රු.13,896,406 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට විලම්භිත බදු වත්කම් රු.23,124,285ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එම අගය රු.7,856,456ක් ලෙස දක්වා තිබීමෙන් විලම්භිත බදු වත්කම් රු.15,267,829කින් අඩුවෙන්ද වර්ෂයේ විලම්භිත බදු ආදායම් ලෙස රු.16,980,756 ක් හඳුනාගත යුතු වුවද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ එම ආදායම් ලෙස රු.1,712,928 ක් හඳුනාගෙන තිබීමෙන් විලම්භිත බදු ආදායම් රු.15,267,828කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) ඉදිරි වර්ෂයට අදාළ රු.14,015,293ක ස්ථාවර තැන්පතු පොළිය සමාලෝචිත වර්ෂයට ඇතුළත් කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වෙනත් මෙහෙයුම් අදායම් හා ලැබිය යුතු ආයෝජන පොළිය එම විටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලෙන් (UNDP) ලැබුණු ප්‍රදානවලින් දරන ලද රු.1,235,838කට සමාන ප්‍රමාණයක් ආදායම් ලෙස හඳුනා නොගෙන මුළු ලැබීම වන රු.12,500,000 ක් වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ඉදිරියට ගෙනා රු.20,572,935ක් වූ ලැබිය යුතු ආදායම් බද්ද පිළිබඳව නහවුරුවක් ගෙන කපා හැරීම් වෙනුවට නාගරික සංවර්ධන අඩු ආදායම්ලාභීන්ගේ නිවාස ව්‍යාපෘතියේ (UDLIHP) ණයවල ලැබිය යුතු හිඟහිටි පොළී ගිණුමට මාරු කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු ණය පොළිය රු.53,142,999ක්, ණය හා ලැබිය යුතු යටතේ දැක්විය යුතු වුවද, එය වෙනත් වත්කම් යටතේ දක්වා තිබුණි.

(ක) ආදායම් බදු අඩි වෙන් කිරීම රු.2,319,635ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදමට එරෙහිව ගැලපීමට කටයුතු නොකර සමුච්චිත අරමුදලට ගළපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.86,751,731ක් වුවද එය රු.172,730,801ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.85,979,070කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඝ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය රු.69,641,957ක් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය රු.28,571,556 ක් අඩුවෙන් හා මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහය රු.113,769,524ක් වැඩියෙන් ද වශයෙන් වෙනස්කම් නිරීක්ෂණය විය.

ඉහත විස්තර කර ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකල වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මා ගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, නිසි ගිණුම් වාර්තා අරමුදල තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය..

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම් කොටසේ දක්වා ඇති (අ), (ඇ), (උ) සහ (ඌ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නිර්ණායකවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. වෙනත් කරුණු

3.1 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන ලද ලාභය පදනම් කරගෙන රු.825,000ක ප්‍රසාද දීමනාවක් ගෙවා තිබුණද මෙම වාර්තාවේ 1.2 (ඊ) අනුව කළ යුතු මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කළේ නම් එය අලාභයක් වන බැවින් එසේ ප්‍රසාද දීමනා ගෙවීම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
විස්තීරණ ආදායම් ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

	සටහන්	2022 රු	2021 රු
පොලී ආදායම	4	289,204,262	275,545,152
පොලී වියදම	5	113,769,524	126,304,798
ශුද්ධ පොලී ආදායම		**175,434,738**	**149,240,354**
වෙනත් මෙහෙයුම් ආදායම්	6	165,600,174	63,434,258
මුළු මෙහෙයුම් ආදායම		**341,034,912**	**212,674,612**
අපහායන ගාස්තු	13	(340,829,524)	9,956,340
ශුද්ධ මෙහෙයුම් ආදායම		**681,864,436**	**202,718,272**
පුද්ගලික වියදම්	7	29,388,809	26,846,049
ක්ෂය දේ.පි.උ	14	1,120,942	1,758,084
ප්‍රදාන ක්‍රමක්ෂයකිරීම්	8	29,997,185	74,910,206
වෙනත් මෙහෙයුම් වියදම්	9	13,995,967	11,900,825
බදු වලට පෙර මෙහෙයුම් ලාභය		**607,361,533**	**87,303,108**
බදු වියදම්	10	36,418,499	16,237,444
වර්ෂය සඳහා ලාභය		**570,943,034**	**71,065,664**
වෙනත් විස්තීර්ණ ආදායම්			
සැලසුම්ගත ප්‍රතිලාභ සැලසුම මත සත්‍ය හානිය	18	(1,023,134)	(156,388)
විලම්භිත බදු		(1,712,928)	(3,400,207)
මුළු විස්තීර්ණ ආදායම		**573,679,095**	**67,821,845**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය තත්ව ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

	සටහන්	2022 රු	2021 රු
වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	11	121,162,801	86,751,731
බැංකු ශේෂය	12	598,000,000	948,000,000
ණය සහ ලැබිය යුතු දෑ	13	3,264,342,263	3,454,569,841
දේපල පිරියත සහ උපකරණ	14	1,830,898	2,908,640
විලම්බිත බදු වත්කම්	17.1	7,856,456	6,143,529
වෙනත් වත්කම්	15	99,691,917	109,801,288
මුළු වත්කම්		**4,092,885,334**	**4,608,175,029**
හිමිකම් සහ වගකීම්			
වගකීම්			
පොලී සහිත ණය ගැනීම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	16	4,263,982,469	4,590,440,319
වර්තමාන බදු වගකීම	17	36,418,499	16,237,444
විලම්බිත බදු වගකීම	17.1	-	-
පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම	18	4,853,000	5,912,476
වෙනත් වගකීම්	19	7,811,220	32,900,492
මුළු වගකීම්		**4,313,065,189**	**4,645,490,731**
හිමිකම්			
රඳවාගත් ඉපයුම්		(220,179,855)	(37,315,702)
මුළු වගකීම් හිමිකම්		**4,092,885,334**	**4,608,175,029**

මෙකී මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අනුකූලව පිලියෙල කර ඇති අතර එමගින් 2022 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ සැබෑ කටයුතු පිලිබඳ සාධාරණ සහ සත්‍ය තත්වය සහ එහි අවසන් වූ කාල පරිච්ඡේදයෙහි අතිරික්තය පිලිබිඹු කරන බවට සහතික කෙරේ.

එස්.එම්.ඩී.බී.සමරකෝන්
ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ)

කේ.ඒ.ඩී.ඩී.කහඳවල
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය සහ පරිපාලන)

මෙකී මූල්‍ය ප්‍රකාශයන් පිලියෙල කර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩලය වගකීමට බැඳේ. කොමසාරිස් මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළා;

නීල් බණ්ඩාර හපුහින්න
සභාපති

ඩබ්.ජී.කේ.එල්.චන්ද්‍රසේකර
භාණ්ඩාගාර නියෝජිත

2023 පෙබරවාරි 24

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

	සටහන්	2022 රු	2021 රු
මෙහෙයුම් ක්‍රියාකාරිත්වය මගින් වන මුදල් ප්‍රවාහය			
බදු වලට පෙර ලාභය		**607,361,533**	**87,303,108**
ගැලපුම් කිරීම්			
ක්ෂය සහ ක්‍රමක්ෂය		31,118,127	76,668,290
අපහායන ගාස්තු		(340,829,524)	9,956,340
ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම්		(443,541)	(4,197,514)
වෙනත් ආදායම්		-	(4,474,276)
පාරිතෝෂික සහ උපචිත වියදම්		1,470,221	-
පොලී වියදම්		113,769,524	126,304,798
ආයෝජන ආදායම්		(151,743,746)	(57,990,871)
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය		**260,702,593**	**233,569,876**
වෙනත් වත්කම් (වැඩිවීම්)/අඩුවීම්		9,263,274	(25,505,193)
වෙනත් වගකීම් (වැඩිවීම්)/අඩුවීම්		(95,933)	28,263,967
මෙහෙයුම් මගින් උපදවන ලද මුදල්		**269,869,934**	**236,328,650**
ඉදිරියට ගෙනා ශුද්ධ ණය ගැනියන්		(324,197,221)	(46,295,221)
ගෙවූ බදු		(13,917,809)	-
ගෙවූ පාරිතෝෂික		(1,052,973)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්		**(69,298,069)**	**190,033,429**
ආයෝජන ක්‍රියාකාරකම් මගින් ලද මුදල් ප්‍රවාහ			
මිලදී ගැනීම් දේපල පිරියත සහ උපකරණ		(43,199)	-
දේ.පි.සහ උ විකිණීම මගින් ඉදිරියට ගෙනා		-	-
අසපෘෂ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම්		-	(1,873,200)
ශුද්ධ ආයෝජන		350,000,000	50,000,000
ලැබුණ ආයෝජන ආදායම්		107,995,643	57,990,871
ආයෝජන ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්		**457,952,443**	**106,117,671**
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ලද මුදල් ප්‍රවාහ			
ගෙවන ලද පොලී වියදම්		(440,222,374)	(382,130,169)
ශුද්ධ ණය ගැනීම්			
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් උපදවන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්		(440,222,374)	(382,130,169)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)		**(51,567,999)**	**(85,979,069)**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		172,730,801	172,730,801
වර්ෂාවසාන මුදල් සහ මුදල් සමාන දෑ		**121,162,800**	**86,751,731**
බැංකු අයිරා ශේෂය	11	121,162,801	86,751,731
		121,162,801	**86,751,731**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

	රඳවාගත් ඉපයුම් රු	මුළු හිමිකම් රු
2021 ජනවාරි 01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත*)	(105,196,793)	(105,196,793)
රඳවාගත් ඉපයුම් සඳහා ගැලපුම්	59,246	59,246
වසරේ ලාභය	71,065,664	71,065,664
Other comprehensive income (net of tax)	(3,243,819)	(3,243,819)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	(37,315,702)	(37,315,702)
2022 ජනවාරි 01 දිනට	(37,315,702)	(37,315,702)
රඳවාගත් ඉපයුම් සඳහා ගැලපුම්	2,286,606	2,286,606
2021 සඳහා SLFRS 9 ප්‍රතිපාදන	(758,829,854)	(758,829,854)
වසරේ ලාභය	570,943,034	570,943,034
වෙනත් විස්තීර්ණ ආදායම් (ශුද්ධ බදු)	2,736,062	2,736,062
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	(220,179,855)	(220,179,855)

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

		2022	2021
4	**පොලී ආදායම්**	රු	රු
	ණය සහ අත්තිකාරම් වෙතින් පොලිය	289,204,262	275,545,152
		289,204,262	275,545,152

		2022	2021
5	**පොලී වියදම්**	රු	රු
	භාණ්ඩාගාර ණය ගැනීම් සඳහා පොලී වියදම්	**113,769,524**	**126,304,798**

		2022	2021
6	**වෙනත් මෙහෙයුම් ආදායම්**	රු	රු
	ආයෝජන ආදායම	151,743,746	57,990,871
	සේවක ණය පොළී	912,887	969,111
	දඩ ආදායම් (බේරුම්කරන ලද හානි) සහ වෙනත්	443,541	4,474,276
	UNDP ප්‍රදානය	12,500,000	-
		165,600,174	63,434,258

		2022	2021
7	**පුද්ගලික වියදම්**	රු	රු
	වැටුප් සහ අනෙක් ප්‍රතිලාභ	25,339,210	23,076,061
	සේ.අ.අ. සහ සේ.නි.භා. අ	2,831,801	2,906,597
	පාරිතෝෂික වියදම්	1,217,798	863,391
		29,388,809	**26,846,049**

		2022	2021
8	**ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්-LGIIP**	රු	රු
	ණය ප්‍රදාන	41,258,082	103,031,380
	අඩු කළා: ණය ප්‍රදාන	11,260,897	28,121,174
	ශුද්ධ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම්	**29,997,185**	**74,910,206**

		2022	2021
9	**වෙනත් මෙහෙයුම් වියදම්**	රු	රු
	කාර්යාල පරිපාලන සහ ආයතන වියදම්	12,300,527	11,250,281
	වෘත්තීය සහ නෛතික වියදම්	141,602	243,667
	විගණක පාරිශ්‍රමිකයන්	318,000	406,877
	UNDP වියදම	1,235,838	
		13,995,967	**11,900,825**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

		2022	2021
10	**බදු වියදම්**	රු	රු
	වර්තමාන බදු ප්‍රතිපාදන	36,418,499	16,237,444
	වර්තමාන බදු සඳහා අව ප්‍රතිපාදන / (අධි ප්‍රතිපාදන)	-	-
	විලම්බිත බදු වියදම්/(ආදායම)	-	3,400,207
		36,418,499	19,637,651
10.1	බදු වලට පෙර ගිණුම්කරන ලාභ/(අලාභ)	607,361,533	87,303,108
	එකතුකරන ලද අවසර නොදුන් අයිතම	(364,303,528)	37,315,547
	එකතුකරනලද අවසර දෙන ලද අයිතම	(1,030,779)	(1,722,039)
	ව්‍යාපාරයේ ගැලපුම් කරන ලද ලාභ	242,027,226	122,896,616
	පොලී ආදායම්	(151,743,746)	(57,990,871)
	මුළු ව්‍යවස්ථාපිත ආදායම	90,283,480	64,905,745
	අඩු කළා -අවසර ලත් හානි	(90,283,480)	-
	බදු අයකල හැකි ආදායම	-	64,905,745
10.2	ව්‍යවස්ථාපිත බදු අනුපාතය		
	වර්තමාන ආදායම් බදු වියදම	36,418,499	16,237,444
	(කාලපරිච්ඡේදය සඳහා බදු වගකීම් සහ අනුපාතය - 24%)		

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

		2022	2021
		රු	රු
11	**මුදල් සහ මුදල් සමාන දෑ**		
	බැංකුවල ඇති ඉතුරුම් තැන්පතු	109,820,895	50,357,626
	බැංකුවල ඇති ජංගම තැන්පතු	11,341,906	36,394,105
	ආපසු යැවූ මිලදී ගැනීම්	-	-
		121,162,801	**86,751,731**

		2022	2021
12	**බැංකු ශේෂය**	රු	රු
	බැංකුවල ඇති ස්ථාවර තැන්පතු	598,000,000	948,000,000
		598,000,000	948,000,000

		2022	2021
13	**ණය සහ ලැබිය යුතු දෑ**		
		රු	රු
	ලැබිය යුතු ණය (සටහන 13.1)	4,597,391,109	4,369,617,357
	අඩුකළා : අපහායන සඳහා දීමනා (සටහන 13.2)	1,333,047,846	915,047,516
		3,264,343,263	**3,454,569,841**

		2022	2021
13.1	**විශ්ලේෂණය - (ව්‍යාපෘති මගින්)**		
	දේශීය ණය සහ සංවර්ධන අරමුදල	2,728,984,447	2,272,701,992
	LGIIP	381,405,347	518,039,065
	PCDP	75,411,862	78,486,975
	UDLIHP	1,390,026,338	1,477,564,464
	NWSDB	4,790,505	5,541,380
	කාර්යමණ්ඩල ණය	16,772,609	17,283,481
		4,597,391,109	**4,369,617,357**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

13.2 වසර තුළ අපහායන ගාස්තු චලනය

	2022	2021 (Restated)	2021
ජනවාරි 1 දිනට	1,673,877,370	915,047,516	905,091,176
SLFRS ප්‍රතිපාදන 2021	-	758,829,854	-
වසර තුළ කපා හරින ලද වසර සඳහා ගාස්තු	(340,829,524)	-	9,956,340
දෙසැම්බර් 31 දිනට	1,333,047,846	1,673,877,370	915,047,516

අපහායන ගාස්තු (Individual)	**2022**	2021 (Restated)	2021
අදියර 1			
අදියර 2			
අදියර 3	906,166,187	880,353,444	-
මුළු අපහායන ගාස්තු	906,166,187	880,353,444	880,353,444
-			
අපහායන ගාස්තු (Collective)			
අදියර 1	181,769,137	239,414,027	-
අදියර 2	25,925,218	133,274,878	-
අදියර 3	219,187,303	420,835,021	-
මුළු අපහායන ගාස්තු	426,881,658	793,523,926	34,694,072

14 දේපල පිරියත සහ උපකරණ පිරිවැය

ක්ෂය	**2022.01.01** දිනට පිරිවැය	එකතු කිරීම්	අපහරණ/මාරු	**2022.12.31** දිනට පිරිවැය
කාර්යාල උපකරණ	1,725,753	-	-	1,725,753
ලී බඩු සහ උපකරණ	1,748,813	-	-	1,748,813
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග	11,964,598	43,199	-	12,007,798
මෝටර් වාහන	7,995,000	-	-	7,995,000
එකතුව	**23,434,164**	**43,199**	-	**23,477,364**

සමුච්චිත ක්ෂය

විස්තරය	**2022.01.01** දිනට ශේෂය	වසර සඳහා ක්ෂය කිරීම්	අපහරණ/මාරු	**2022.12.31** දිනට ශේෂය
කාර්යාල උපකරණ	1,359,815	142,118	-	1,501,933
ලී බඩු සහ උපකරණ	1,123,341	113,699	-	1,237,041
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග	10,047,368	865,124	-	10,912,493
මෝටර් වාහන	7,995,000	-	-	7,995,000
එකතුව	**20,525,525**	**1,120,942**	-	**21,646,466**
ලියා හල අගය	**2,908,640**			**1,830,898**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

		2022	2021
15	**වෙනත් වත්කම්**	රු	රු
	ලැබිය යුතු ඇවර කරන ලද හානි	1,480,731	1,480,731
	පළාත් පාලන අධිකාරී වෙත LGIIP ප්‍රදාන	-	41,258,082
	බඩු වට්ටෝරු	114,083	114,082
	ලැබිය යුතු ණය පොළී	53,142,999	23,700,376
	ලැබිය යුතු ආයෝජන පොළී	43,748,104	12,205,808
	ලැබිය යුතු බදු	-	20,572,935
	වෙනත් ලැබිය යුතු දෑ	1,206,000	10,469,274
		99,691,917	**109,801,288**

		2022	2021
16	**පොලී සහිත ණය ගැනීම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ**	රු	රු
	දේ.ණ.සහ සං. අ	73,095,983	90,219,520
	LGIIP	2,991,401,014	3,139,381,466
	PCDP	42,791,445	45,871,377
	UDLIHP	1,156,694,026	1,314,967,956
		4,263,982,469	**4,590,440,319**

17	**වර්තමාන බදු වගකීම්**	**2022**	**2021**
		රු	රු
	වසර මුල ශේෂය	-	-
	එකතු කළා : වර්තමාන වසර සඳහා ප්‍රතිපාදන/ප්‍රතිපාදන යටතේ ගැලපුම්	36,418,499	16,237,444
	අඩු කළා: වසර තුළ ගෙවීම්	-	-
	රඳවාගත් බදු	-	-
		36,418,499	**16,237,444**

17.1	**විලම්බිත බදු වගකීම් / (වගකීම්)**	**2022**	**2021**
		රු	රු
	විලම්බිත බදු වත්කම්	36,418,499	6,576,914
	විලම්බිත බදු වගකීම්	433,385	433,385
		6,143,529	**6,143,529**

18	**පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම**	**2022**	**2021**
		රු	රු
	ජනවාරි 1 දිනට	5,912,476	5,205,473
	ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් ප්‍රමාණය	1,217,798	863,391
	විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත් ප්‍රමාණය	(1,023,134)	(156,388)
	වසර තුළ කරන ලද ගෙවීම්	(1,254,140)	-
	දෙසැම්බර් 31 දිනට	**4,853,000**	**5,912,476**



දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

		2022	2021
18.1	**ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගන්නා ලද ප්‍රමාණය**		
	වර්තමාන සේවා පිරිවැය	853,554	395,616
	පොලී පිරිවැය	364,244	467,775
		1,217,798	863,391
18.2	**පාරිතෝෂික වගකීම් ගණනය කිරීම් පිණිස භාවිතා කරනා මූලික උපකල්පනයන් පහත පරිදි වේ:**		
	පොලී අනුපාතය	18%	11%
	වැටුප් වර්ධක අනුපාතය	Fixed increment per annum	Fixed increment per annum
	කාර්ය මණ්ඩල පිරිවැටුම	6.0%	5.0%
	විශ්‍රාමික වයස	60 years	62 years

18.3 ගණනය කිරීමේදී යොදා ගන්නා උපකල්පනයන්ගේ සංවේදීතාව

2022 දෙසැම්බර් 31 දිනට වැදගත් උපකල්පන සඳහා වන ප්‍රමාණාත්මක සංවේදී විශ්ලේෂණය පහත පරිදි වේ.

උපකල්පන	**වට්ටම් අනුපාතය**	
සංවේදී මට්ටම	**1%** වැඩිවීම	**1%** අඩුවීම
නිර්වචනය කරන ලද වගකීම් මත වන බලපෑම	5,526,951	6,348,825

		2022	2021
19	**වෙනත් වගකීම්**	රු	රු
	ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන	(0)	11,260,897
	දේ.ණ.සහ සං.අ ප්‍රාග්ධන ප්‍රදාන	673,453	1,116,994
	ගෙවිය යුතු විලම්බිත බදු	6,567,344	-
	කලින් ගෙවූ ණයගැතියෝ සහ අත්තිකාරම්	570,423	19,856,245
	වෙනත් ගෙවිය යුතු		666,356
		7,811,220	**32,900,492**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

20.වියදම් ඛණ්ඩනය	**2022**	**2021**
	රු	රු
පුද්ගල වියදම්		
කාර්ය මණ්ඩල වැටුප්	18,078,495	16,091,679
ගැලපුම් දීමනා	-	-
ජීවන වියදම් දීමනාව- දේ.ණ.සහ සං. අ	2,950,870	3,385,200
කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා	825,000	555,000
සභාපති හට දීමනා	624,635	690,885
කොමසාරිස්වරුන් ගේ දීමනා	372,450	389,773
අතිකාල සහ නිවාඩු දින වැටුප්	148,186	127,063
සංවර්ධන සහකාර- ගමන් වියදම්	386,000	476,396
සංවර්ධන නිලධාරී සඳහා දීමනා	54,000	54,600
ගමන් වියදම් - කාර්යාල කාර්ය මණ්ඩලය	169,391	94,994
සේවක අර්ථසාධක අරමුදල	2,265,441	2,325,278
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල	566,360	581,319
කාර්ය මණ්ඩල සෞඛ්‍ය රක්ෂණය	1,730,183	1,210,474
පාරිතෝෂික වියදම්	1,217,798	863,391
	29,388,809	**26,846,049**

	2022	2021
වෙනත් මෙහෙයුම් වියදම්	රු	රු
කාර්ය මණ්ඩල සුභසාධන	456,730	383,842
රැස්වීම් සඳහා වියදම්	2,985	-
විගණන වියදම්	318,000	406,877
තැපැල් දුරකථන සහ අන්තර්ජාල පහසුකම්	477,722	464,484
ලිපිද්‍රව්‍ය/මුද්‍රණ	797,359	889,776
වාහන නඩත්තුව	260,489	570,821
ඉන්ධන	826,234	556,237
වාහන රක්ෂණ	72,415	71,982
විදුලිය	736,791	438,394
ආරක්ෂක ගාස්තු	1,092,510	1,133,485
ජල සැපයුම	28,040	13,969
පවිත්‍රතා සේවා ගාස්තු	320,886	277,200
නඩත්තු සහ උපකරණ	142,745	77,304
නඩත්තු සහ ගොඩනැගිලි	29,000	3,825
කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන	-	18,000
පරිගණක නඩත්තුව	1,151,512	663,136
බදු සහ වරිපනම්	-	-
කාර්යාල කුලී	5,808,000	5,588,000
දැනුවත් කිරීමේ වැඩසටහන්	-	-
වෘත්තීය ගාස්තු	95,102	204,667
පුවත් නිවේදන	-	-
නෛතික වියදම්	46,500	39,000
මුද්දර ගාස්තු	300	300
බැංකු ගාස්තු	810	600
වෙනත් වියදම්	96,000	98,925
	12,760,129	**11,900,825**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

21 බැඳීම් සහ අවිනිශ්චිතතා

අරමුදලේ උපරිම දැනුම සහ ඊට ඇති තොරතුරු අනුව වාර්තාකරණ දිනයට අරමුදලට වැදගත් බැඳීම් සහ අවිනිශ්චිතතා කිසිවක් නැත.

21.1 පහත දැක්වෙනුයේ 2022 දෙසැම්බර් 31 දිනට විසඳා නොමැති අරමුදලට එරෙහිව ඇති නෛතික ඉල්ලීමය. ඒවායේ අවසන් ප්‍රතිපල පිලිබඳව ඇති අවිනිශ්චිතතා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්ට ගැලපුම් කර නැත. සාධාරණ ඇස්තමේන්තු සහ ප්‍රතිඵලයේ නිශ්චිතතාව පිලිබඳව ලබා දෙනු ලබන වෘත්තික උපදෙස් මත නෛතික හිමිකම් සම්බන්ධයෙන් වන අහිතකර බලපෑම් උදෙසා, අවශ්‍ය වන්නේ නම් මූල්‍ය ප්‍රකාශනයන්ට තවදුරටත් ගැලපුම් කරනු ලැබේ.

(i) අරමුදලේ හිටපු සේවකයකු විසින් කම්කරු විනිශ්චය සභා නඩුවක් ලෙස අංක 64/7455/2015 යටතේ රත්නපුර කම්කරු උසාවියෙහි නඩුවක් පවරා ඇති අතර ඒ විභාගය සඳහා 2022 ජනවාරි 18 ට දින නියම කර ඇත.

22 වාර්තාකරණ දිනයට පසුව හටගත් සිදුවීම්

ශේෂ පත්‍ර දිනය සහ ගිණුම් අත්සන් තබන ලද දිනය අතර කිසිදු සිද්ධියක් හටගෙන නොමැති අතර කිසිදු භෞතික ගැටළුවක් හටගෙන නොමැත. මූල්‍ය ප්‍රකාශයෙහි අනාවරණය කල යුතු වන්නාවූ හෝ ගැලපුම් කල යුතු වන්නාවූ කිසිදු සිදුවීමක් නැත.

23 වැදගත් අදාල පාර්ශව

වැදගත් අදාල පාර්ශව පිලිබඳ අනාවරණ විස්තර පහත පරිදි වේ;

23.1 ප්‍රධාන කළමණාකරණ පුද්ගලයන් සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 24 ‘අදාල පාර්ශව අනාවරණ‘‘ අනුව ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් යන්නට සැලසුම් කිරීම, අධ්‍යක්ෂණය, සහ ව්‍යාපාරයේ කටයුතු පාලනය කිරීමට අධිකාරීත්වය ඇති පුද්ගලයන් ඇතුලත් වේ. ඒ අනුව අරමුදලේ කොමසාරිස් මණ්ඩලය සමාගමේ ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් ලෙස වර්ග කර ඇත.

23.2 ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් හට වන්දි	**2022**	**2021**
	රු	රු
කෙටි කාලීන සේවා නියුක්ති ප්‍රතිලාභ		
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	997,085	1,080,658

* ප්‍රධාන කළමණාකරන පුද්ගලයන් සමග ඇති කරගෙන තිබෙන සේවා නියුක්ති ගිවිසුම් අනුව ඔවුන් හට අරමුදල මගින් මුදල් නොවන ප්‍රතිලාභ කිසිවක් ලබා දී නොමැත.

* ප්‍රධාන කළමණාකරන පුද්ගලයන්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්, සහ ඔවුන්ගේ සම්බන්ධතා ඇති ආයතන සමග අරමුදල කිසිදු ගණුදෙනුවක් සිදු කර නොමැති අතර කිසිදු වැඩ පිලිවෙලකට හෝ ගිවිසුමකටද ඇතුලත් වී නොමැත.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

24.LLDF බණ්ඩ ලෙස විස්තීර්ණ ආදායම

	2022				
	දේ.ණ.සහ සං. අ.	LGIIP	PCDP	UDLIHP	ඒකාබද්ධ කිරීම-දේ.ණ.සහ අ
පොලී ආදායම	232,616,479	150,123,894	3,524,512	55,596,010	441,860,894
පොලී වියදම	5,908,991	46,535,795	3,497,692	57,827,045	113,769,524
ශුද්ධ පොලී ආදායම	**226,707,487**	**103,588,099**	**26,819**	**2,231,035**	**328,091,371**
වෙනත් මෙහෙයුම් ආදායම්	12,943,541	-	-	0.05	12,943,541
මුළු මෙහෙයුම් ආදායම	**239,651,028**	**103,588,099**	**26,819**	**2,231,.35**	**341,034,912**
අපහායන ගාස්තු	(203,055,214)	(28,735,628)	(5,611,161)	(103,427,521)	(340,829,524)
ශුද්ධ මෙහෙයුම් ආදායම	**442,706,242**	**132,323,727**	**5,637,981**	**101,196,486**	**681,864,436**
පුද්ගල වියදම්	20,652,015	8,926,742	**2,311**	192,260	29,388,809
ක්ෂය PPE	787,704	340,482	**88**	7,333	1,120,942
ප්‍රදාන ක්‍රමක්ෂය	-	29,997,185	-	-	29,997,185
වෙනත් මෙහෙයුම් වියදම්	9,835,203	4,251,223	**1,101**	91,560	13,995,967
බදුවලට පෙර මෙහෙයුම් ලාභය	**411,431,318**	**88,808,093**	**5,634,481**	**101,487,640**	**607,361,533**

	2021				
	LLDF	**LGIIP**	**PCDP**	**UDLIHP**	**Consolidation-LLDF**
පොලී ආදායම	174,803,990	89,343,102	3,780,866	66,577,177	334,505,135
පොලී වියදම	7,237,148	48,530,130	3,801,687	66,735,833	126,304,798
ශුද්ධ පොලී ආදායම	**167,566,842**	**40,812,972**	**(20,821)**	**158,656**	**208,200,337**
වෙනත් මෙහෙයුම් ආදායම්	4,474,276	-	-	-	4,474,276
මුළු මෙහෙයුම් ආදායම	**172,041,117**	**40,812,972**	**(20,821)**	**158,656**	**212,674,612**
අපහායන ගාස්තු	5,199,002	1,197,736	179,546	3,380,056	9,956,340
ශුද්ධ මෙහෙයුම් ආදායම	**166,842,115**	**39,615,236**	**(200,366)**	**(3,538,713)**	**202,718,272**
පුද්ගල වියදම්	21,716,857	5,151,846	**2,628**	20,027	26,846,049
ක්ෂය PPE	1,422,185	337,382	**(172)**	1,312	1,758,084
ප්‍රදාන ක්‍රමක්ෂය	-	74,910,206	-	-	74,910,206
වෙනත් මෙහෙයුම් වියදම්	9,627,059	2,283,808	**(1,165)**	8,878	11,900,825
බදුවලට පෙර මෙහෙයුම් ලාභය	**134,076,012**	**(43,068,007)**	**(196,401)**	**3,508,496**	**87,303,108**

*මූල්‍ය වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ප්‍රාග්ධනය මත පදනම්ව අපහායන ගාස්තු බෙදා ඇත.

**එක් එක් බණ්ඩයෙහි මුළු මෙහෙයුම් ආදායම මත මෙහෙයුම් පිරිවැය බෙදනු ලැබේ.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

25. සාධාරණ අගයන්

ආදර්ශයන් සඳහා බාහිරින් කැඳවනු ලබන මිල ගණන් ඇසුරින් හෝ නිරීක්ෂණය කළ හැකි මිල යෙදවුම් ඇසුරින් සාධාරණ අගය තීරණය කරනු ලබනා අවස්ථාවන්හිදී මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණයන් හෝ තහවුරු කිරීම් ලබාගන්නා ලදී. ක්‍රියාශීලී වෙළඳපලකදී විකුණුම් මිල පිලිබඳ සෘජු නිරීක්ෂණයන් කළ නොහැකිය. මේ තත්වයන් යටතේ සමාගම මූල්‍ය උපකරණයන්හි වලංගුතාව තහවුරු කිරීම පිණිස, වඩා අදාල සහ විශ්වසනීය සේ සැලකෙන තොරතුරු වලට වැඩි බරක් තබමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

ඇගයුම් තාක්ෂණවේදයන් මගින් මූල්‍ය උපකරණයන්හී සාධාරණ අගය තීරණය කිරීම හෝ අනාවරණය කිරීම පිණිස අරමුදල පහත සඳහන් ධුරාවලිය භාවිතා කරයි.

අදියර 1: සමාන වත්කම් සහ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපලින් කැඳවන ලද මිල ගණන් (ගැලපුම් නොකරනලද)

අදියර 2: සෘජුව හෝ වක්‍රව වාර්තා කරන ලද සාධාරණ අගය මත වැදගත් බලපෑමක් ඇත්තාවූ සියළු යෙදවුම් නිරීක්ෂණය කළ හැකි අනෙක් තාක්ෂණවේදයන්.

අදියර 3: නිරීක්ෂණය කළ නොහැකි වෙළඳපල දත්ත මත පදනම් නොවන වාර්තාගත සාධාරණ අගය මත වැදගත් බලපෑමක් ඇති යෙදවුම් භාවිතා කරන ශිල්ප ක්‍රම

මූල්‍ය ප්‍රකාශණයන්හී සාධාරණ අගය මගින් නොදැක්වෙන අරමුදලේ මූල්‍ය උපකරණ වල සාධාරණ අගය සහ ඉදිරියට ගෙනා අගය පිලිබඳ පංතිය අනුව සංසන්දනයක් පහත දැක්වේ.

දෙසැම්බර් 31 දිනට	සාධාරණ අගය පිලිබඳ ධුරාවලිය	ඉදිරියට ගෙනා වටිනාකම්		සාධාරණ අගය	
		2022	2021	2022	2021
		රු	රු	රු	රු
මූල්‍ය වත්කම්					
මුදල් සහ මුදල් සමාන දෑ		121,162,801	86,751,731	121,162,801	86,751,731
බැංකු ශේෂයන්		598,000,000	948,000,000	598,000,000	948,000,000
ණය සහ ලැබිය යුතුදෑ	අදියර 2	3,264,343,263	3,444,613,501	1,258,545,639	1,328,047,620
වෙනත් වත්කම්		99,691,917	109,801,288	99,691,917	109,801,288
එකතුව		**4,083,197,980**	**4,589,166,520**	**2,077,400,357**	**2,472,600,639**
මූල්‍ය වගකීම්					
ණයට ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවුම් සඳහා දරණ පොලිය	අදියර 2	4,263,982,469	4,590,440,319	1,259,165,842	1,355,569,749
වෙනත් වගකීම්		7,811,220	32,900,492	7,811,220	32,900,492
එකතුව		**4,271,793,689**	**4,623,340,811**	**1,266,977,062**	**1,388,470,242**

අ) කෙටි කාලීනව කල් පිරෙන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා (මාස තුනකට අඩු) ඉදිරියට ගෙනා වටිනාකම් ඒවායේ සාධාරණ අගයට දළ වශයෙන් සමාන වන බව උපකල්පනය කෙරේ. මෙකී උපකල්පනය අතැති මුදල්, බැංකු ශේෂයන්, අනෙක් මූල්‍ය වත්කම්, බැංකු අයිරා සහ කල්පිරෙන විශේෂිත කාලයක් නැති අනෙක් මූල්‍ය වගකීම් සඳහා අදාල වේ.

ආ) සාමාන්‍ය ණය කාලසීමාව සඳහා වන සාමාන්‍ය ණය අනුපාතය භාවිතා කරමින් ස්ථාවර පොලී අනුපාත ඇති ලැබිය යුතු ණය සාධාරණ අගයට ලක් කෙරිණි. මීට ප්‍රතිවිරුද්ධව පොලී සහිත ණය සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු වටිනාකම් බරතැබූ සාමාන්‍ය අරමුදල් පිරිවැය මත වට්ටම් කරන ලදී.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

26. වත්කම් සහ වගකීම් කල් පිරීම

	2022			2021		
වත්කම්	වසරකට අඩු	වසරකට වැඩි	ඉදිරියට ගෙනා මුළු වටිනාකම	වසරකට අඩු	වසරකට වැඩි	ඉදිරියට ගෙනා මුළු වටිනාකම
	රු	රු	රු	රු	රු	රු
මුදල් සහ මුදල් සමාන දෑ	121,162,801	-	121,162,801	86,751,731	-	86,751,731
බැංකු ශේෂයන්	598,000,000	-	598,000,000	948,000,000	-	948,000,000
ණය සහ ලැබිය යුතුදෑ	391,721,192	2,872,622,071	3,264,343,263	414,548,381	3,031,259,881	3,444,613,501
දේපල පිරියත සහ උපකරණ	-	1,830,898	1,830,898	-	1,150,556	1,150,529
විලම්බිත බදු වත්කම්	-	7,856,456	7,856,456	-	6,143,529	6,143,529
වෙනත් වත්කම්	99,691,917	0	99,691,917	68,543,206	41,258,082	109,801,288
මුළු වත්කම්	1,210,575,909	2,882,309,425	4,092,885,334	1,516,648,557	3,079,812,048	4,596,460,605
වගකීම්						
පොලී සහිත ණය සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු	241,981,083	4,022,001,386	4,263,982,469	241,981,083	4,348,459,236	4,590,440,319
වර්තමාන බදු වගකීම	-	36,418,499	36,418,499	-	16,237,444	16,237,444
විලම්බිත බදු වගකීම	-	-	-	-	-	-
පශ්චාත් රැකියා නියුක්ති වාසි පිලිබඳ බැඳීම්	-	4,853,000	4,853,000	-	5,756,088	5,756,087
වෙනත් වගකීම්	7,137,767	673,453	7,811,220	20,522,601	12,377,891	32,900,492
	249,118,850	4,063,946,339	4,313,065,189	262,503,684	4,382,830,659	4,645,334,343

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

27. අවදානම් කළමණාකරනය

27.1 හැඳින්වීම

සිය මූල්‍ය උපකරණ භාවිතා කිරීමේදී අරමුදල පහත අවදානම්වලට නිරාවරණය වේ. :

ණය අවදානම
ද්‍රවශීලතා අවදනාම
වෙළඳපල අවදානම

මේ සටහන මගින් අරමුදලේ එකිනෙක අවදානමට නිරාවරණය වීම, අරමුදලේ අරමුණු, ප්‍රතිපත්ති සහ අවදානම් මැනීම සහ කළමණාකරනය පිලිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ.

27.2 ණය අවදානම

ණය අවදානම යනු පාරිභොගිකයකු හෝ මූල්‍ය උපකරණයන්ට සම්පාර්ශවයක් සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුවෙන් අරමුදලට සිදුවන මූල්‍ය හානියකි. ප්‍රධාන වශයෙන්ම ණය අවදානමක් හට ගනුයේ ලැබිය යුතු ණය සම්බන්ධයෙන් අරමුදලට ලැබිය යුතු දෑ සහ බැංකු සහ මූල්‍ය ආයතන වෙතැති තැන්පතු සම්බන්ධයෙනි.

ණය වටිනාකම් ඇගයුම සහ පිරිනමනු ලබන ණය කාලීන සමාලෝචනයට ලක් කිරීම මගින් ණය අවදානම කළමනාකරනය කරනු ලබයි.

අරමුදල ණය සහ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් ලැබිය යුතුවන දෑ සම්බන්ධව සිදුවන හානි පිලිබඳ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනා අපහායනයන් උදෙසා වන දීමනාවක් ස්තාපිත කරයි. හානි සිදුවීම හට ගෙන ඇති එහෙත් හඳුනාගෙන නැති අවස්ථාවන්හිදී ව්‍යාපෘති පදනම්න් සමාන ලැබිය යුතු දෑ වෙනුවෙන් ණය අවදානම වෙනුවෙන් ස්ථාපිත සාමූහික අපහායනය උදෙසා වන දීමනාවකින් අරමුදලේ අපහායන ප්‍රතිපත්තිය සමන්විත වේ. මේ සාමූහික අපහායනය තීරණය කරනු ලබන්නේ සමාන මූල්‍ය වත්කම් සඳහා ගෙවුම් සංඛ්‍යාලේඛණයන්හී ඓතිහාසික දත්ත මත පදනම්වය.

27.2.1 **අමතර ඇප සහ ණය ඉහළ දැමීම් හී සාධාරණ අගය**

අරමුදලේ අමතර ඇප සහ ණය ඉහළ දැමීම් හී සාධාරණ අගය පහත වගුවෙන් දැක්වේ.

2022 දෙසැම්බර් 31 දිනට	**2022**		**2021**	
	ණය අවදානමට උපරිම නිරාවරණය වීම	**ශුද්ධ නිරාවරණය වීම**	**ණය අවදානමට උපරිම නිරාවරණය වීම**	**ශුද්ධ නිරාවරණය වීම**
	රු	රු	රු	රු
මුදල් සහ මුදල් සමාන දෑ	121,162,801	121,162,801	86,751,731	86,751,731
බැංකු සහ මූල්‍ය ආයතනයන්හී ශේෂය	598,000,000	598,000,000	948,000,000	948,000,000
ණය සහ ලැබිය යුතු දෑ	3,264,343,263	3,264,343,263	3,454,569,841	3,454,569,841
වෙනත් මූල්‍ය වත්කම්	99,691,917	99,691,917	109,801,288	109,801,288
	4,083,197,980	4,083,197,980	4,589,166,520	4,589,166,520

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

27. අවදානම් කළමණාකරනය (ඉතිරි...)

27.2 ණය අවදානම (ඉතිරි...

27.2.2 මූල්‍ය වත්කම් හී පංතිය අනුව ණය තත්වය

a) 2022 දෙසැම්බර් 31 දිනට

වත්කම්	ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද Neither past due nor impaired රු	ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද රු	තනි තනිව අපහායනය කරන ලද රු	එකතුව රු
මුදල් සහ මුදල් සමාන දෑ	121,162,801			121,162,801
බැංකු ශේෂ	598,000,000			598,000,000
ණය සහ ලැබිය යුතු දෑ	3,264,343,264	426,881,658	906,166,187	4,597,391,109
වෙනත් වත්කම්	99,691,917			99,691,917
මුළු වත්කම් එකතුව	**4,083,197,981**	**426,881,658**	**906,166,187**	**5,416,245,826**

b) 2021 දෙසැම්බර් 31 දිනට

වත්කම්	ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද රු	ලැබිය යුතු කල් ඉකුත්වූ හෝ අපහායනය නොකරන ලද රු	තනි තනිව අපහායනය කරන ලද රු	එකතුව රු
මුදල් සහ මුදල් සමාන දෑ	86,751,731	-	-	86,751,731
බැංකු ශේෂ	948,000,000	-	-	948,000,000
ණය සහ ලැබිය යුතු දෑ	3,454,569,842	34,694,072	880,353,444	4,369,617,357
වෙනත් වත්කම්	109,801,288			109,801,288
මුළු වත්කම් එකතුව	**4,599,122,860**	**34,694,072**	**880,353,444**	**5,514,170,376**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

27. අවදානම් කළමණාකරනය (ඉතිරි...)

27.3 ද්‍රවශීලතා අවදානම

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් යෙදවීම මගින් පියවනු ලබනා මූල්‍ය වගකීම් හා බැඳුනු බැඳීම් සම්පූර්ණ කිරීමට යාමේදී අරමුදලට ඇතිවන අවදානම ද්‍රවශීලතා අවදානම නම් වේ.

ද්‍රවශීලතා අවදානම කළමණාකරනය කිරීම සඳහා සමාගම සියළු මූල්‍ය උපකරණයන් පිලිබඳ කල්පිරුම් විශ්ලේෂණය භාවිතා කරයි.

අ) ද්‍රවශීලතා අවදානමට නිරාවරණය වීම

සිය ප්‍රධාන අරමුදල් සම්පාදන මූලාශ්‍රය ලෙස අරමුදල ණය ගැනීම් කෙරේ විශ්වාසය තබයි. තරගකාරී මිල ගණන් පවත්වා ගැනීම සහ වෙළඳපල ප්‍රවණතා පිලිබඳ අනුවර්ත අධීක්ෂණය මගින් අරමුදල සක්‍රීයව අවදානම කළමණාකරනය කරයි.

ආ) ද්‍රවශීලතා අවදානම කළමණාකරනය කිරීම

ද්‍රවශීලතා කළමණාකරනය පිණිස අරමුදලේ ප්‍රවේශය වනුයේ අරමුදල් සම්පාදකයන් සමග වන ණය ගිවිසුම් සහ නියාමන අවශ්‍යතා නිතිපතා පවත්වාගනෙ යන අතර අරමුදලේ මූල්‍ය තත්වය අවදානමේ නොහෙලා නැතිනම් අනවශ්‍ය හානි සිදු නොවන බවට වගබලා ගනිමින් අවශ්‍ය වන පරිදි ප්‍රමාණවත් ද්‍රවශීලතාවන් තිබෙන බවට වගබලා ගැනීමයි.

27.3.1 වට්ටම් රහිත දළ පිටතට ගලා යාම් මත පදනම්ව මූල්‍ය වගකීම් පිලිබඳ කල්පිරීම් විශ්ලේෂණය

අ)	**2022 දෙසැම්බර් 31 දිනට**	ඉදිරියට ගෙනා වටිනාකම	දළ නාමික පිටතට ගලා යාම්	ඉල්ලුම මත	මාස 3 දක්වා	මාස 3 සිට 12 දක්වා	වසරකට වැඩි
	පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු	4,263,982,469	4,368,721,467	-	-	346,720,080	4,022,001,386
	වෙනත් වගකීම්	7,811,220	7,811,220	-	252,423	318,000	7,240,797
		4,271,793,689	**4,376,532,687**	**-**	**252,423**	**347,038,080**	**4,029,242,184**

ආ)	**2021 දෙසැම්බර් 31 දිනට**	ඉදිරියට ගෙනා වටිනාකම	දළ නාමික පිටතට ගලා යාම්	ඉල්ලුම මත	මාස 3 දක්වා	මාස 3 සිට 12 දක්වා	වසරකට වැඩි
	පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු	4,590,440,319	4,695,179,317	-	-	346,720,080	4,348,459,236
	වෙනත් වගකීම්	32,900,492	32,900,492		348,356	318,000	32,234,136
		4,623,340,811	**4,728,079,809**	**-**	**348,356**	**347,038,080**	**4,380,693,373**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

27. අවදානම් කළමණාකරනය (ඉතිරි...)

27.4 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු මූල්‍ය ආයතනයක අනාගත මුදල් ප්‍රවාහයන් හී සාධාරණ අගය වෙළඳපල මිල ගණන් වෙනස් වීම මත උච්ඡාවචනය වීමේ අවදානමයි.
අරමුදලේ මෙකී වෙළඳපල අවදානම ප්‍රධාන වශයෙන්ම සමන්විත වනුයේ පොලී අනුපාත අවදානම සහ මුදල් අවදානම මගිනි.
වෙළඳපල අවදානම කළමණාකරනය කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ ලාභය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගනිමින් පිලිගත හැකි පරාමිතීන් තුළ අවදානම් සඳහා නිරාවරණය වීමේ ඉඩ කළමණාකරනය සහ පාලනය කිරීමයි. .

27.4.1 පහත වගුව මගින් වෙළඳ නොවන මූල්‍ය වත්කම් සහ වගකීම් මත අරමුදලේ පොලී අනුපාත අවදානම් නිරාවරණය විශ්ලේෂණය කිරීමයි. සමාගමේ වත්කම් සහ වගකීම් ඉදිරියට ගෙනා වටිනාකම් තුළ ඇතුලත් වන අතර ගිවිසුම්ගත ප්‍රති මිලකරණය හෝ කල්පිරෙන දින මගින් වර්ගීකරණය කරනු ලබයි.

a)	2022 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුම මත	මාස 3 ට අඩු	මාස 4 සිට 12 දක්වා	වසර 1 සිට 5 දක්වා	2022දෙසැම්බර් 31 දිනට එකතුව
	පොලී ඉපයුම් වත්කම්					
	මුදල් සහ මුදල් සමාන දෑ	121,162,801	-	-	-	121,162,801
	බැංකු ශේෂ	-	498,000,000	100,000,000	-	598,000,000
	ණය සහ ලැබිය යුතු දෑ	-	97,930,298	293,790,894	2,872,622,071	3,264,343,263
	වෙනත් වත්කම්	-	-	99,691,917	0	99,691,917
	මුළු පොලී ඉපයුම් වත්කම්	**121,162,801**	**595,930,298**	**493,482,810**	**2,872,622,071**	**4,083,197,980**
	පොලී සහිත වගකීම්					
	පොලී සහිත ණය සහ ගැණුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	-	-	241,981,083	4,022,001,386	4,263,982,469
	වෙනත් වගකීම්	-	252,423	318,000	7,240,797	7,811,220
	මුළු පොලී සහිත වගකීම්	**-**	**252,423**	**242,299,083**	**4,029,242,184**	**4,271,793,689**
	පොලී ඉපයුම් වත්කම් පොලී සහිත වගකීම් - ශුද්ධ වත්කම්/(වගකීම් අතර පරතරය	**121,462,801**	**595,677,875**	**251,183,727**	**(1,156,620,112)**	**(188,595,709)**

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

27. අවදානම් කළමණාකරනය (ඉතිරි...)

b) 2021 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුම් මත	මාස 3 ට අඩු	මාස 4 සිට 12 දක්වා	වසර එකට වැඩි	2021 දෙසැම්බර් 31 දිනට එකතුව
පොලී ඉපයුම් වත්කම්					
මුදල් සහ මුදල් සමාන දෑ	86,751,731	-	-	-	86,751,731
බැංකු ශේෂ	-	848,000,000	100,000,000	-	948,000,000
ණය සහ ලැබිය යුතු දෑ	-	103,338,405	310,015,215	3,031,259,881	3,444,613,501
වෙනත් වත්කම්	-	-	68,543,206	41,258,082	100,801,288
මුළු පොලී ඉපයුම් වත්කම්	**86,751,731**	**951,338,405**	**478,558,421**	**3,072,517,963**	**4,589,166,520**
පොලී ඉපයුම් වගකීම්					
පොලී සහිත ණය ගැනුම් සහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ	-	-	241,981,083	4,348,459,236	4,590,440,319
වෙනත් වගකීම්	-	348,356	318,000	32,234,136	32,900,492
මුළු පොලී සහිත වගකීම්	**-**	**348,356**	**242,299,083**	**4,380,693,373**	**4,623,340,811**
පොලී සහිත වත්කම් සහ පොලී සහිත වගකීම් අතර පරතරය	**86,751,731**	**950,990,049**	**236,259,339**	**(1,308,175,410)**	**(34,174,291)**

27.4.2 පොලී අනුපාත සංවේදීතාව

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පවත්වාගන්නා අනෙක් සියළු විචල්‍යයන් සමග පොලී අනුපාතයන්හී සිදුවිය හැකි සාධාරණ වෙනස්කම් පිලිබඳ සංවේදීතාව පහත වගුව මගින් ඉදිරිපත් කෙරේ.

	2022		2021	
	පොලී අනුපාතයේ වැඩිවීම/අඩුවීම	බදු වලට පෙර ලාභයට වන බලපෑම	පොලී අනුපාතයේ වැඩිවීම/අඩුවීම	බදු වලට පෙර ලාභයට වන බලපෑම
		රු		රු
පොලී අනුපාත	+ 1%	60,736,153	+ 1%	8,730,311
පොලී අනුපාත	- 1%	(60,736,153)	- 1%	(8,730,311)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

වාර්තා කරනු ලබන ආයතනය

1.1. සාමාන්‍ය තොරතුරු

දේශීය ණය සහ සංවර්ධන අරමුදල යනු (දේ.ණ.සහ.සංඅ) 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ආඥා පණත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ කොළඹ 7 වෝඩ් පෙදෙසෙහි අංක 24 ඒ යන ස්ථානයෙහිය.

1.2. ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් හී ස්වභාවය

මෙකී අරමුදලෙහි ප්‍රධාන කර්තව්‍යය වනුයේ පොදු පහසුකම් උදෙසා දේශීය අධිකාරීන් හට ණය පහසුකම් සම්පාදනය කිරීමය. දේශීය ණය සංවර්ධන අරමුදලේ ඉලක්කය වනුයේ දේශීය මට්ටමේ යටිතල පහසුකම් සඳහා මූල්‍යනය කරනා නියමු මූල්‍ය ආයතනයක් බවට පත්වීමය.

2. සැකසීමේ පදනම

2.1. ඒකාබද්ධ කිරීම සඳහා පදනම

දේශීය ණය සංවර්ධන අරමුදලේ, නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ, බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතියේ සහ පලාත් පාලන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ උප කර්තව්‍යයන් ලෙස සෘජු ආදායම් සහ වියදම් වෙන වෙනම ක්‍රියාත්මක කර වසර අවසානයේ දී ඒකාබද්ධ කරනු ලබනා කොටස් හඳුනාගනු ලබයි. වත්කම් සහ වගකීම් ද ශේෂ පත්‍රයහි ඒකාබද්ධ කරනු ලැබේ.

2.2. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

ඒකාබද්ධ මූල්‍යයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කරනු ලබන අතර සියළු වටිනාකම් වෙනත් ආකාරයකට දක්වා නොමැති සෑම අවස්ථාවකදීම ආසන්නතම රුපියලට ගණන් බලා ඇත.

2.3. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ව්‍යාපාර වස්තුවල වෙනස් වීම පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් යන ලේඛන වලින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශය සමන්විත වන අතර ඒවා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සකසන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූලව සකසා ඉදිරිපත් කර ඇත. (SLFRSs and LKASs)

2.4 මූල්‍ය ප්‍රකාශ පිලිබඳ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුකූල වන සේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් මණ්ඩලය වගකීමට බැඳෙයි. මෙකී වගකීමට පහත අංශ ඇතුලත් වේ. වංචා සහ වැරදි හේතුවෙන් සිදුවිය හැකි වැරදි ප්‍රකාශයන්ගෙන් තොරව ප්‍රකාශන පිලියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

2.5. කොමසාරිස් මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වන අරමුදලේ මූල්‍ය ප්‍රකාශ **2023** පෙබරවාරි **24** දින කොමසාරිස් මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

2.6. මිණුම් සඳහා වන පදනම

මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශයෙහි දැක්වෙන පහත සඳහන් ද්‍රව්‍යමය අයිතමයන් හැරුණ විට අරමුදලේ මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය පදනම මත පිලියෙල කර ඇත.

අයිතම	මිණුම් සඳහා වන පදනම
නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම්	සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කල පසු නිර්වචනය කරන ලද ප්‍රතිලාභ බැඳීම් හී වර්තමාන වටිනාකම හඳුනාගැනීම

2.7. කැපී පෙනෙනා ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කිරීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හී වාර්තාකරණ ලද ප්‍රමාණයන්ට බලපානු ලබනා විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සැකසීමට කළමණාකරනයට අවශ්‍ය වන්නාවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම. මෙකී ඇස්තමේන්තු වලට වඩා තථ්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය. පෙර කාල පරිච්ඡේදයට අදාලව වාර්තා කරන ලද ඇතැම් සංඛ්‍යාවන් වැරදි නිවැරදි කිරීමේ අරමුණින් නැවත ප්‍රකාශ කර ඇත. ඇස්තමේන්තු සහ වැදගත් උපකල්පනයන් අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබනා සහ බලපානු ලබනා අනාගත කාල පරිච්ඡේදයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු පිලිබඳ සංශෝධනයන් හඳුනා ගැනේ. ඇස්තමේන්තු කරනු ලබනා වඩාම වැදගත් කලාප, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයන්හී හඳුනාගනු ලබන ප්‍රමාණයන්ට ඉහලම වැදගත් බලපෑම කරනා ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කිරීමෙදී වන අවිනිශ්චිතතා සහ තීරක විනිශ්චයන් පහත පරිදි දැක්වේ.

2.7.1. අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ගිණුම්කරන පදනම

අඛණ්ඩ පදනමින් ක්‍රියාත්මක වීම සඳහා අරමුදලට ඇති හැකියාව පිලිබඳව කොමසාරිස් මණ්ඩලය විසින් තක්සේරුවක් කර ඇති අතර පුරෝකථිත අනාගතය තුළ ඊට අඛණ්ඩව ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට මණ්ඩලය සෑහීමට පත්ව ඇත. තවද අඛණ්ඩ පදනමින් අරමුදලට ක්‍රියාත්මක වීමට වැදගත් බලපෑමක් කළ හැකි කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවක් ගැන මණ්ඩලය නොදන්නා අතර අරමුදලේ මෙහෙයුම් නවතා ලීමට හෝ ඇවර කිරීමට ඔවුහු අපේක්ෂා නොකරති. එහෙයින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනමින් අඛණ්ඩව පිලියෙල කෙරේ.

2.7.2. බදුකරණය

අරමුදල ආදායම් බදුවලට යටත්වන අතර මෙකී මූල්‍ය ප්‍රකාශනයන් පිලියෙල කරනු ලබන අවස්ථාව වන විට අදාල වන්නාවූ බදු නීති පිලිබඳ නිර්වචනයන්ට අදාලව පවතින අවිනිශ්චිතතා හේතුවෙන් වර්තමාන, විලම්බිත සහ අනෙක් බදු නීර්ණය කිරීමට විනිශ්චයක් අවශ්‍ය වේ.

2.7.3. පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම්

පුරෝකථිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වසරේ පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම සහ අදාල ගාස්තුව තීරණය කරනු ලබයි. ඇගයුම් ක්‍රමය වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාත ආදිය පිලිබඳ උපකල්පනයන් සමග සම්බන්ධ වේ. මෙකී වගකීම්වල දීර්ඝ කාලීන ස්වභාවය මත මේ ඇස්තමේන්තු කැපීපෙනෙනා අවිනිශ්චිතතාවන්ට යටත් වේ. සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයකදීම සියළු උපකල්පනයන් සමාලෝචනය කරනු ලබයි.

2.7.4. දේපල, පිරියත සහ උපකරණයන්හී ප්‍රයෝජනවත් ආයු කාලය

සෑම වාර්තාකරණ දිනයකදීම අරමුදල විසින් හී ශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ආයු කාලය, ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙකී වටිනාකම්, අනුපාත, ක්‍රමවේද ඇස්තමේන්තු කිරීමේදී කළමණාකරනයේ විනිශ්චය භාවිතා කරන අතර එහෙයින් එය අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

2.8. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

2.8.1. බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක - LKAS 12 (ආදායම් බදු) අනුව, වර්තමාන සහ විලම්බිත බදුකරණය සම්බන්ධයෙන් වන කාලපරිච්ඡේදය සඳහා ලාභ හෝ අලාභ තීරණය කිරීමේදී ඇතුලත් කරනා ප්‍රමාණයේ එකතුව බදු වියදම වේ. හිමිකම් තුළ සෘජුවම හඳුනාගන්නා අයිතමයන්හට හෝ හිමිකම් හෝ අනෙක් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගන්නා අවස්ථාවන්හිදී අනෙක් විස්තීර්ණ ආදායම් දක්වා අදාල වන දුර හැර බදු වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ආදායම් බදු වියදම හඳුනා ගැනේ.

අ) වර්තමාන බදු

පනවන ලද බදු අනුපාත හෝ බදු නීති හෝ වාර්තාකරණ දිනයෙහිදී සැලකිය යුතු ලෙස පනවනු ලබන සහ පූර්ව වර්ෂවලට අදාලව ගෙවිය යුතු බදුවලට කරනා කවර හෝ ගැලපුම් භාවිතා කරමින් පවත්නා වර්ෂයට අදාලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ගෙන් අය කරගනු හෝ ඔහුට ගෙවනු ලබන්නට අපේක්ෂා කරනා ප්‍රමාණයන්ගෙන් වර්තමාන බදු වත්කම් සහ වගකීම් සමන්විත වේ.

ඒ අනුව 2006 අංක 10 දරණ දේශීය ආදායම් පණතේ විධිවිධාන සහ මූල්‍ය ප්‍රකාශනයන්හී 10.2 සටහනේ විශේෂයෙන් දක්වා ඇති අනුපාත පිලිබඳ සංශෝධනයන් අනුව බදු කාර්යය සඳහා ගැලපුම් කරන ලද ලාභය මත බදු සඳහා ප්‍රතිපාදන සැපයේ.

ආ) **විලම්බිත බදුකරණය**

වත්කම් සහ වගකීම් වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරන කාර්යය උදෙසා ඒවායේ ඉදිරියට ගෙනා වටිනාකම් අතර වාර්තාකරණ දිනයට පවත්නා තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු සම්පාදනය කෙරේ.

පනවනු ලැබ ඇති හෝ වාර්තාකරණ දිනය වන විට සැලකිය යුතු ලෙසින් පනවනු ලබනා නීති මත පදනම්ව, තාවකාලික වෙනස්කම් ආපසු හරවන අවස්ථාවේදී තාවකාලික වෙනස්කම් සඳහා අදාල කරගැනීමට අපේක්ෂිත බදු අනුපාත අනුව විලම්බිත බදු මනිනු ලැබේ.

වර්තමාන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක හිමිකමක් තිබේ නම් විලම්බිත බදු වත්කම් සහ වගකීම් හිලවු කරනු ලබන අතර ඒවා එකම බදු අයකල හැකි ව්‍යාපාරයෙහි එකම බදු අධිකාරිය හෝ වෙනස් බදු අධිකාරීන් විසින් අයකරනු ලබනා ආදායම් බදුවලට අදාල වේ. නමුදු ශුද්ධ පදනමක් මත වර්තමාන බදු වත්කම් සහ වගකීම් පියවීමට අදහස් කෙරෙන අතර නැතිනම් බදු වත්කම් සහ වගකීම් එකවරම මුදල් කෙරේ.

භාවිතා කල හැකි දෙයට පටහැනිව තිබිය හැක්කාවූ අනාගත බදු අයකල හැකි ලාභයක පැවතිය හැකිදුරක් දක්වා භාවිතා නොකරන ලද බදු හානි, බදු ණය සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කමක් හඳුනා ගැනේ. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු සමාලෝචනය කරනු ලබන අතර තව දුරටත් අදාල බදු ප්‍රතිලාභ අත්කරගත නොහැකි දුරක් දක්වා අඩු කෙරේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි විලම්බිත බදු වගකීම්වල ඉදිරියට ගෙනා වටිනාකම් හී ශුද්ධ වැඩිවීම විලම්බිත බදු වියදම ලෙස හඳුනාගන්නා අතර ඊට විලෝම වශයෙන් කවර ශුද්ධ අඩුවීමක් වුව විලම්බිත බදු වියදම ආපසු හැරවීමක් ලෙස හඳුනා ගැනේ.

2.8.2. මුදල් සහ මුදල සමාන දෑ

මුදල් සහ මුදල සමාන දෑ යනුවෙන් අදහස් කෙරෙනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ක්ෂණිකව මුදල බවට හැරවිය හැක්කාවූ කෙටිකාලීන ආයෝජන සහ වටිනාකම් මාරුවේදී සුළු මට්ටමේ අවදානමකට යටත්වන්නාවූ දෑ ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධයෙන් ගත් කළ මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල්, බැංකු වල ඇති තැන්පතු ගෙවිය යුතු ශුද්ධ බැංකු අයිරාවන් යනාදියෙනි. එසේම අත්පත් කරගත් දිනට සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් ඇතුලත කල්පිරෙන්නාවූ මූල්‍ය උපකරණයන්ද මුදල් සමාන දෑ යන්නට ගැනේ.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.8.3. දේපල, පිරියත සහ උපකරණ පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ පසුව එන කවර හෝ සමුච්චිත ක්ෂය සහ කවර හෝ පසු සමුච්චිත අපහායන හානි අඩුකල පිරිවැයට දැක්වේ. සියළුම ආකාරයේ දේපල, පිරියත සහ උපකරණ පලමුව වාර්තාකරනු ලබන්නේ පිරිවැයටය.
දේපල, පිරියත සහ උපකරණ යනු ඒ වත්කම් අපේක්ෂිත පාවිච්චියට ගත හැකි වන මට්ටමට ගෙන ඒමේදී දරන්නට සිදුවන වියදම්ද ඇතුළුව එකී වත්කම් හී අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයයි. අනෙක් සියළුම අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය හටගන්නා අවස්ථාවේදී ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගනු ලබයි.

ක්ෂය
හීනවන ක්ෂය ක්‍රමය භාවිතා කරමින් භාවිතා කළ හැකි ජීව කාලය මත වත්කමෙහි ඉතිරි වටිනාකම අඩුකර පිරිවැය ලියා හැරිය හැකිවනසේ ක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගන්නා අතර මීලට ගත් වසරේදී ක්ෂය ප්‍රතිපාදන නොකරනු ලබයි. ඇස්තමේන්තු ගත භාවිත කාලය, ඉතිරි වටිනාකම සහ ක්ෂය ක්‍රමය සෑම වසරක් අවසානයේ හව්‍යතා පදනමකින් ඇස්තමේන්තුවේ කවර හෝ වෙනස්වීමක බලපෑම සලකමින් සමාලෝචනය කරනු ලබයි. දේපල, පිරියත සහ උපකරණයන්හී ඇස්තමේන්තුගත භාවිත ජීව කාලය පහත පරිදි වේ;

ස්පෘෂ්‍ය වත්කමෙහි පංතිය	භාවිතා කල හැකි ජීව කාලය
ලී බඩු සහ උපකරණ	වසර 10
කාර්යාල උපකරණ	වසර 5
පරිගණක සහ මෘදුකාංග	වසර 4
මෝටර් වාහන	වසර 5

නැවත හඳුනාගැනීම

අපහරණය කරනු ලබන අවස්ථාවේදී හෝ වත්කමෙන් එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවන්හිදී දේපල, පිරියත සහ උපකරණ නැවත හඳුනාගැනීම කරනු ලබයි. කිසියම් දේපල,පිරියත හෝ උපකරණ නැවත හඳුනාගැනීමකදී වන ලාභ හෝ පාඩුව තීරණය කරනු ලබන්නේ වත්කමෙහි විකුණුම් මුදල සහ ඉදිරියට ගෙනා වටිනාකම අතර වෙනස මගිනි. එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

2.8.4. ගෙවිය යුතු සහ ලැබිය යුතු ණය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම

ගෙවිය යුතු ණය මගින් නිරූපණය වනුයේ පළාත් පාලන අධිකාරීන් වෙත ලබාදීම සඳහා 'ආ' සංරචකය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ණය සමග LGIIP ව්‍යාපෘතිය වෙතින් ලැබෙනා ශ්‍රී ලංකා රජයේ අරමුදල්ය. ලැබිය යුතු ණය මගින් නියෝජනය වනුයේ ණය සංරචකය සමග පලාත් පාලන අධිකාරීන් වෙත බෙදා හැරි ප්‍රදානයන්ය. වියදමක් ලෙස සලකනු ලබන ලැබිය යුතු ණය ප්‍රදාන එකී ක්‍රියාකාරකමෙන් පොලී ලැබෙනා වසර ගණනාව පුරා ක්‍රමානුකූල පිලිවෙලකට ආදායම් ප්‍රකාශය තුළ විලම්භනය සහ ක්‍රමක්ෂය කරනු ලබයි. ගෙවිය යුතු ණයද මේ ක්‍රමය යටතේම ක්‍රමක්ෂය කරනු ලබයි. මෙහිදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ඒකාබද්ධ බදු වලට පෙර ලාභය බදු පෙර සහ ශුද්ධ ක්‍රමක්ෂය ලාභයෙන් 5% ට වඩා අඩු නොවිය යුතුය.

2.8.5. බඩු වට්ටෝරු

බඩු වට්ටෝරු මගින් රුපියල් 5000 ට වඩා අඩු වටිනාකමින් යුත් අයිතමයන් නියෝජනය කෙරෙන අතර ඒවා දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගත නොහැකිය. තවද බඩු වට්ටෝරු පොතෙහි වර්ගීකරණය පිණිස වත්කමෙහි ජීවිකාලය සැලකිල්ලට ගනු ලබයි. යම් වත්කමක ජීව කාලය සැලකිය යුතු දුරකට ගමන් නොකරන්නේ නම් එහි පිරිවැය වියදමක් ලෙස සලකා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබයි.

2.8.6. පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම්

ඒ) තීරණය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම -පාරිතෝෂික

පාරිතෝෂික යනු නීර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුමකි. අරමුදල වාර්ෂිකව පාරිතෝෂික ලෙස පොරොන්දුව ඇති විශ්‍රාම ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය කර බලයි. එය නීර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුමකි. නීර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ සැලසීම පිණිස වන පිරිවැය තීරණය කරනු ලබන්නේ ආයු ගණක තක්සේරුකරුවකුගේ විශේෂඥ දැනුම භාවිතා කරමින් ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය මගිනි.

නීර්ණය කරනු ලබන ප්‍රතිලාභ සැලසුමක ආයුගණක වාසි සහ පාඩු වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හටගන්නා කාල පරිච්ඡේදය තුළ පූර්ණ ලෙසම හඳුනා ගැනේ.
මෙකී පාරිතෝෂික වගකීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් නොසැපයේ.

ඉ) නීර්ණය කරන දායකත්ව සැලසුම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන් ගේ භාර අරමුදල අදාල නීති රීති හා රෙගුලාසි වලට අනුව සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන් ගේ භාර අරමුදල ට දායකත්වයන් ගෙවීමට සේවකයන් හිමිකම් ලබයි.

2.8.7. ප්‍රතිපාදන

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අරමුදලට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සකාර්ය) ඇති විට සහ එකී බැඳීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් බැහැරට ගලා යායුතු වන්නාවූ තත්වයක් පවතින විට මෙන්ම එකී බැඳීමෙහි ප්‍රමාණය සම්බන්ධයෙන් විශ්වසනීය ඇස්තමේන්තුවක් පිලියෙල කිරීමට හැකි විටක ඒ සඳහා ප්‍රතිපාදන හඳුනා ගැනේ.

2.8.8. වෙනත් මූල්‍ය නොවන වත්කම්

වෙනත් සියළු මූල්‍ය නොවන වත්කම් එහි ඉදිරියට ගෙනා වටිනාකම ඇස්තමේන්තුගත මුදල් කල හැකි වටිනාකමට අඩු කළ හැකිවන සේ අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂිත ප්‍රතිපාදන මත අගයනු ලැබේ.

2.8.9. වෙනත් මූල්‍ය නොවන වගකීම්

වෙනත් මූල්‍ය නොවන වගකීම් එහි සාමාන්‍ය ප්‍රමාණය අනුව හඳුනා ගැනේ.

2.8.10. මූල්‍ය නොවන වත්කම් අපහායනය

කිසියම් වත්කමක් සඳහා අපහායනයක් පිලිබඳ අවශ්‍යතාවක් වේදැයි බලා ගනු පිණිස අරමුදල සෑම වාර්තාකරණ දිනයකම තක්සේරුවක් සිදු කරයි. එසේ අපහායනයක් කළ යුතු යයි ඇඟවුමක් වේ නම් එසේත් නැතිනම් කිසියම් වත්කමක් සඳහා වාර්ෂික අපහායන පරීක්ෂාවක් අවශ්‍ය වේ නම් අරමුදල වත්කමෙන් අයකරගත හැකි වටිනාකම සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කරයි. යම් වත්කමක එසේ අයකරගත හැකි වටිනාකම එකී වත්කමෙහි භාවිත වටිනාකම සහ විකුණුම් පිරිවැය අඩු කල පසු සාධාරණ අගයට වඩා වැඩි විය යුතුය. අනෙක් වත්කම් හෝ වත්කම් සමූහයන් ගෙන් විශාල වශයෙන් ස්වාධීන වන්නාවූ මුදල් ගලා ඒමක් උත්පාදනය නොවන්නේ නම් තනි තනි වත්කම් ලෙස ගැනීමට තීරණ කරනු ලබයි. කිසියම් වත්කමක ඉදිරියට ගෙනා වටිනාකම එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවා යන අවස්ථාවන්හිදී වත්කම අපහායනය කරන ලදැයි සැලකෙන අතර එය එහි අයකරගත හැකි වටිනාකමට ගිණුම්ගත කරනු ලබයි.

2.8.11. මූල්‍ය උපකරණ-මූලික හඳුනාගැනීම සහ අනුෂාංගික මිණුම්

අරමුදලේ මූල්‍ය උපකරණ ණය, ලැබිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම් වලින් සමන්විත වන අතර එහි අනුෂාංගික මිණුම් අපහායනය සහ නැවත හඳුනාගැනීම් පිලිබඳ ගිණුම්කරන ප්‍රතිපත්ති පහත දැක්වේ.

i) **මූල්‍ය වත්කම්**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 39 තුළ, මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය සුදුසු ලෙස තීරණය කරනු ලබන ආකාරයට ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරෙනතුරු රඳවාගන්නා ආයෝජන සහ විකුණුම් සඳහා ඇති මූල්‍ය වත්කම් තුළින් සාධාරණ අගය මත මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණයට ලක් කෙරේ. සියළු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ අගය සහ (සාධාරණ අගය මත නොමැති වත්කම් සම්බන්ධයෙන් ලාභ හෝ අලාභ මත) සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයෙහි එකතුව මත හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපලෙක මිල සඳහන් නොවන ස්ථාවර හෝ නිර්ණය කල හැකි ගෙවුම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ආරම්භක මිණුමින් පසු අපහායන අගය අඩු කර සඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් එවන් මූල්‍ය වත්කම් පසුව ක්‍රමක්ෂය පිරිවැය මත පසුව මණිනු ලැබේ. මෙකී ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත්කර ගැනීම මත වන වට්ටම් හෝ වාරික සහ සඵලදායී පොලී අනුපාතයෙහි ඒකාබද්ධ කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. මෙකී සඵලදායී පොලී අනුපාත ක්‍රමය යටතේ වන ක්‍රමක්ෂය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආදායම තුළ ඇතුලත් වේ. අපහායනයෙන් පැන නගින්නාවූ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ණය සහ ලැබිය යුතු දෑ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

නැවත හඳුනාගැනීම

පහත අවස්ථාවලදී මූල්‍ය වත්කමක් හඳුනාගැනේ (එසේ නැතිනම් අදාල වන පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්)

i. වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති අයිතිය කල්පැන ඇති විට.
ii. අරමුදල වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති තම අයිතිය මාරු කර ඇති විට හෝ තෙවන පාර්ශවයකට ‘pass-through’ වැඩපිලිවෙලක් හරහා භෞතික ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහයත් පූර්ණ වශයෙන්ම වගකීමක් සඳහා ගෙවීමට භාරගෙන ඇති විට සහ

අ)අරමුදල වත්කමෙහි අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම මාරු කර ඇති විට හෝ

ආ)අරමුදල වත්කමෙහි සියළු අවදානම් හෝ ප්‍රතිලාභ බොහෝ කොට මාරු කර හෝ රඳවා තබාගෙන නොමැති එහෙත් වත්කමෙහි පාලනය මාරු කර ඇති විට.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය වත්කම් අපහායනය
ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 අනුව හානිකරණ ගාස්තු

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොලැබෙන පහත සඳහන් මූල්‍ය උපකරණවල අපේක්ෂිත මූල්‍ය අලාභය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදල විසින් පාඩු දීමනා හඳුනාගනී.

- මුදල් හා මුදල් සමාන දෑ,
- බැංකු සමඟ ස්ථානගත කිරීම්,
- අනෙකුත් පාරිභෝගිකයන් වෙත ණය හා අත්තිකාරම්

ණය අවදානම් තක්සේරු කිරීම හා අපේකෂිත මූල්‍ය අලාභය ඇස්තමේන්තු කිරීම අපක්ෂපාතී හා සම්භාවී විය යුතු අතර අතීත සිදුවීම්, වර්තමාන තත්ත්වයන් හා වාර්තා කරන දිනයේ ආර්ථික තත්ත්වයන් පිළිබඳ සාධාරණ හා අනුබල දෙන පුරෝකථනයන් පිළිබඳ තොරතුරු ඇතුළුව තක්සේරුවට අදාළ සියලු තොරතුරු ඇතුළත් කළ යුතුය. මීට අමතරව, අපේක්ෂිත මූල්‍ය අලාභ ඇස්තමේන්තුවේදී මදලේ කාල වටිනාකම සැලකිල්ලට ගත යුතුය.

ගනුදෙනුකරුවන්ගේ ණය හා අත්තිකාරම් මත හානිකරණ ගාස්තු
පූර්ව නිශ්චිත සීමාවකට වඩා වැඩි ණය හා අත්තිකාරම් සඳහා ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් දේශීය ණය සංවර්ධන අරමුදල විසින් වෙන් වෙන්ව තක්සේරු කරයි. යම් ණයක් වෙන් වෙන්ව හානිකරණය වී ඇත්නම්, අලාභයේ ප්‍රමාණය වත්කම රැගෙන යන මුදල හා අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරයි. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් එක් හානියක් යටතේ ප්‍රතිපාදන අවශ්‍ය නොවන බව තීරණය කරන්නේ නම්, එවැන් මූල්‍ය වත්කම් ඉතිරි කළඹ සමඟ කිසියම් හානිකරණයක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ලැබේ.

දේශීය ණය සංවර්ධන අරමුදල ප්‍රධාන කොටස් තුනක් භාවිතා කරමින් අපේක්ෂිත මූල්‍ය අලාභය ගණනය කරයි. එනම්, පැහැරහැරීම් සම්භාවිතාව (PD), පැහැරහැරීමේ පාඩුව (LGD) හා සාමූහික තක්සේරුව යටතේ පැහැරහැරීම් නිරාවරණයයි (EAD). මෙම පරාමිතීන් සාමාන්‍යයන් ව්‍යුත්පන්න කර ඇත්තේ අභ්‍යන්තර සංවර්ධිත සංඛ්‍යාන ආකෘති හා ඓතිහාසික දත්ත වලින් වන අතර පුසව ඉදිරි තොරතුරු පිළිබිඹු වන ලෙස සකස් කර ඇත.

- පැහැරහැරීම් සම්භාවිතාව (PD) - පැහැරහැරීමේ සම්භාවිතාව නියෝජනය කරන්නේ ණය ගැණුම්කරුවකු ඉදිරි මාස 12 හෝ වගකීමේ ඉතිරි ආයු කාලය තුළ තම මූල්‍ය වගකීම් පැහැරහැරීමේ සම්භාවිතාවයි. පැහැරහැරීමේ සම්භාවිතා ඇස්තමේන්තු නිශ්චිත දිනයක ඇස්තමේන්තු කරන අතර නිරාවරණය සඳහා පැහැරහැරීමේ සම්භාවිතාවේ මූලික ආදානය වන්නේ ගෙවිය යුතු දින වේ. ගෙවිය යුතු දින තීරණය කරනු ලබන්නේ නියමිත දින සිට දින ගණන ගණනය කිරීමෙනි. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කිරීම සඳහා සංඛ්‍යානමය ආකෘති භාවිතා කරන අතර ඉතිරි ආයු කාලය නිරාවරණ පැහැරහැරීමේ සම්භාවිතාව සහ කාලයාගේ ඇවෑමෙන් වෙනස්වීමට අපේක්ෂා කරන ආකාරය පිළිබඳ ඇස්තමේන්තු නිර්මාණය කරයි.

- පැහැරහැරීමේ පාඩුව (LGD) - පැහැරහැරීමේ පාඩුව යනු යම් අවස්ථාවකදී පැහැර හැරීමක් සිදුවූ විට ඇතිවන පාඩුව පිළිබඳ ඇස්තමේන්තුවකි. එය පදනම් වන්නේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හා ණය දෙන්නාට ලැබෙයැයි අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන් අතර වෙනස මතය. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් පැහැරහැරීමේ පාඩු පරාමිති ඇස්තමේන්තු කරන්නේ පැහැර හරින ලද ප්‍රති පාර්ශවයන්ට එරෙහිව නිම්කම් පෑමේ ඓතිහාසික ප්‍රතිසාධන අනුපාතය මත පදනම්වය. වට්ටම් සාධකය ලෙස ඵලදායී පොළී අනුපාත භාවිතා කරමින් වට්ටම් සහිත මුදල් ප්‍රවාහ පදනම මත ඒවා ගණනය කරනු ලැබේ. පැහැරහැරීමේ පාඩුව සාමාන්‍යයන් පැහැරහැරීම් නිරාවරණයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ.

- පැහැරහැරීම් නිරාවරණය (EAD) – පැහැරහැරීම් නිරාවරණය වීම, පැහැරහැරීමකදී අපේක්ෂිත නිරාවරණය පෙන්නුම් කරයි. දේශීය ණය සංවර්ධන අරමුදල විසින් පැහැරහැරීම් නිරාවරණ ඇස්තමේන්තු කරනු ලබන්නේ වාර්තා කරන දිනයේ සිට පැහැරහැරීම් සිදුවීම දක්වා මූලික හා පොළී අපසු ගෙවීම හා කැපකළ පහසුකම්වල අපේක්ෂිත අඩු කිරීම් සැලකිල්ලට ගනිමිනි. අදියර 1 ණයක් සඳහා පැහැරහැරීම් නිරාවරණය ගණනය කිරීමට දේශීය ණය සංවර්ධන අරමුදල විසින් මාස 12 ක් ඇතුළත සිදුවිය හැකි පැහැරහැරීම් සිදුවීම් තක්සේරු කරයි. අනෙකුත් සියලුම ණය සඳහා මූල්‍ය උපරණයේ ආයු කාලය පුරාවටම පැහැරහැරීම් සිදුවීම් සඳහා පැහැරහැරීම් නිරාවරණය සලකා බැලේ.

ii) **මූල්‍ය වගකීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 39 යෙහි විෂය පථය තුළ මූල්‍ය වගකීම් පොලී සහිත ණය දීම් සහ ණය ගැනීම් ලෙස සහ ගැලපෙන පරිදි වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කෙරේ. අරමුදල ආරම්භක හඳුනාගැනීමේදී සිය මූල්‍ය වගකීම් වර්ගීකරණයට ලක් කරන ආකාරය තීරණය කරයි.
වගකීමෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදනයට කොටස්කරුවකු බවට අරමුදල පත්වූ විට අරමුදල මූල්‍ය වගකීම් හඳුනාගන්නා අතර මූල්‍ය වගකීම්වල නිර්වචනයන්ට අනුව ගිවිසුම්ගත වැඩපිලිවෙලෙහි හරය අනුව යමින් මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

මූල්‍ය වත්කම් නැවත හඳුනාගැනීම

වගකීම යටතේ වන බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම මත මූල්‍ය වගකීමක් නැවත හඳුනාගැනේ. පැහැදිලිවම වෙනස් වූ කොන්දේසි මත නැතිනම් පවත්නා වගකීමෙහි කොන්දේසි නවීකරණය කිරීම මත එකම ණය දෙන්නකුගෙන් ගත් වෙනත් ණයක් මගින් පවත්නා මූල්‍ය වගකීම විතැන් කරනු ලබද්දී එවන් නවීකරනයක් මගින් කෙරෙනා හුවමාරුවක් නියම වගකීම නැවත හඳුනාගැනීමක් ලෙසත් නව වගකීමක් හඳුනාගැනීමක් ලෙසත් සලකනු ලබයි. මුල් මූල්‍ය වගකීමෙහි ඉදිරියට ගෙනා වටිනාකම සහ ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාව අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබයි.

iii) **සාධාරණ අගය මැනීම**

වෙළඳපල සහභාගි වන්නන් අතර මණිනු ලබනා දිනයට විධිමත් ගණුදෙනුවක් තුළ වත්කමක් විකිණීමට ලැබෙනා මිල හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබනා මිල සාධාරණ අගය ලෙස සලකනු ලබයි. මෙකී සාධාරණ අගය පිළිබඳ මිණුම වත්කම විකිණීම හෝ වගකීම පැවරීම යන දෙක.

- වත්කමට හෝ වගකීමට අදාල ප්‍රධාන වෙළඳපල තුළ හෝ
- ප්‍රධාන වෙළඳ පලක් නැති තත්වයකදී වත්කම හෝ වගකීමට වඩාත්ම වාසිදායක වෙළඳපල තුළ යන දෙකින් එකක සිදුවන්නේය යන උපකල්පනය මත පදනම් වෙයි. මෙහිදී ප්‍රධාන හෝ වඩාත් වාසිදායක වෙළඳපල යනු අරමුදලට ප්‍රවේශ විය හැකි එකක් වීම අනිවාර්යය වේ.

වත්කමක් හෝ වගකීමක් මිල කරද්දී වෙළඳපල සහභාගිවන්නන් සිය හොඳම ආර්ථික වාසිය තුළ කටයුතු කරන්නේ ය යන උපකල්පනය මත පිහිටා වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මණිනු ලැබේ. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී වත්කම එහි උපරිම සහ හොඳම භාවිතයට යොදා ගැනීම මගින් නැතිනම් එය ඉහලම සහ හොඳම භාවිතයට යොදා ගත හැකි තවත් වෙළඳපල සහභාගි වන්නකු හට විකිණීම මගින් වෙළඳපල සහභාගිවන්නකුට ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට ඇති හැකියාව සැලකිල්ලට ගනු ලබයි.

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

අදාල නිරීක්ෂණය කල හැකි යෙදවුම් උපරිම කරමින් සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් අවම කරමින් අරමුදල සාධාරණ අගය මැනීම පිණිස ප්‍රමාණවත් දත්ත තිබෙනා සහ පවත්නා තත්වයන් තුළ යෝග්‍ය වන්නාවූ අගැයුම් තාක්ෂණවේදයන් සහ භාවිත කරයි.

මූල්‍ය ප්‍රකාශයන් තුළ සාධාරණ අගය මණිනු ලබනා හෝ අනාවරණය කරනු ලබනා සියළු වත්කම් සහ වගකීම් සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිණුමට වැදගත් වන්නාවූ අවම යෙදවුම් මට්ටම මත පදනම්ව සාධාරණ අගය පිලිබඳ ධුරාවලිය තුළ පහත පරිදි වර්ගීකරණයට ලක් කෙරේ.

•මට්ටම 1- අනන්‍ය වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපල තුළ ඉදිරිපත් වන (ගැලපුම් නොකරන ලද) මිලගණන්

- මට්ටම 1 2 - සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි සාධාරණ අගය මිණුමට වැදගත් වන්නාවූ පහළම මට්ටමේ යෙදවුම් සඳහා වන අගැයුම් තාක්ෂණවේදයන්

- මට්ටම1 3 - සාධාරණ අගය අනාවරණය කිරීමේ කාර්යය සඳහා නිරීක්ෂණය කළ නොහැකි වන්නාවූ සාධාරණ අගය මිණුමට වැදගත්වන්නාවූ පහලම මට්ටමේ යෙදවුම්

- සඳහා අගැයුම් තාක්ෂණවේදයන්, වත්කම් සහ වගකීම්වල ස්වභාවය, නෛසර්ගික ලක්ෂණ සහ අවදානම් සහ ඉහත විස්තර කර ඇති පරිදි වන සාධාරණ අගය පිලිබඳ ධුරාවලියෙහි මට්ටම මත පිහිටා අරමුදල වත්කම් සහ වගකීම් වල පංති තීරණය කර ඇත. සාධාරණ අගය මත මණිනු ලබනා ආයෝජන දේපල, සහ වෙනත් දේපල පිරියත සහ උපකරණ වැනි දෙකම සඳහා වන පුනරාවර්තන සාධාරණ අගය මිණුම් සඳහා අරමුදලේ කොමසාරිස් මණ්ඩලය ප්‍රතිපත්ති සහ පරිපාටි තීරණය කරයි.

වැදගත් වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරු විශේෂඥයන් යොදවා ගනු ලබයි. කොමසාරිස් මණ්ඩලය අරමුදලේ කළමණාකාරීත්වය සමග සාකච්ඡා කර ඔවුන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු වාර්ෂිකව මෙකී විශේෂඥ දැනුමින් යුත් බාහිර තක්සේරුකරුවන්ගේ මැදිහත්වීම ගැන තීරණය ගනු ලබයි. වෙළඳපල පිලිබඳ දැනුම, පිලිගැනීම, ස්වාධීනත්වය, සහ වෘත්තීය ප්‍රමිති පවත්වාගෙන යන්නේද යන කරුණු තෝරා ගැනීමේ නිර්ණායකයන් තුළ ඇතුලත් වේ. බාහිර තක්සේරු විශේෂඥයන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව කොමසාරිස් මණ්ඩලය එක් එක් දෑ සම්බන්ධයෙන් කවර තක්සේරු තාක්ෂණවේදයන් සහ යෙදවුම් භාවිතා කරන්නේදැයි තීරණය කරයි.

කොමසාරිස් මණ්ඩලය සෑම වාර්තාකරණ දිනයකදීම අරමුදලේ ගිණුම්කරන ප්‍රතිපත්ති අනුව නැවත මිණුම් කිරීමට හෝ නැවත තක්සේරු කිරීමට අවශ්‍ය වන්නාවූ වත්කම් සහ වගකීම් හී සංචලනයන් විශ්ලේෂණයට ලක් කරයි. අනෙක් අදාල ලේඛණ සහ ගිවිසුම් අගැයුම් ගණනයට ඇති තොරතුරු සමග එකඟවෙමින් මෙකී විශ්ලේෂණය සඳහා කොමසාරිස් මණ්ඩලය නවතම අගැයුමේදී භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම් සත්‍යාපනය කරයි. අරමුදලේ බාහිර තක්සේරු විශේෂඥයන් සමග එක්වෙමින් අරමුදලේ කොමසාරිස් මණ්ඩලය ඇති ව තිබෙනා වෙනස්කම් සාධාරණදැයි තීරණය කිරීම පිණිස බාහිර අදාල මූලාශ්‍රයන් සමගින් සෑම වත්කමක් සහ වගකීමක සාධාරණ අගයෙහි වෙනස සංසන්දනය කර බලයි.

සාධාරණ අගය පිලිබඳ අනාවරණයන් උදෙසා අරමුදල වත්කම හෝ වගකීමෙහි ස්වභාවය, නෛසර්ගික ලක්ෂණ සහ අවදානම සහ ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය පිලිබඳ ධුරාවලියෙහි මට්ටම මත පදනම්ව වත්කම් සහ වගකීම්වල පංතිය තීරණය කරයි.

2.8.12. ආදායම හඳුනාගැනීම

අරමුදලට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සඳහා ඉඩක් තිබේද යන්න සහ ගෙවීම් කරනු ලබන අවස්ථාව සැලකිල්ලට නොගෙන, ආදායම සහ සිදුවන හෝ සිදුවිය හැකි ආශ්‍රිත පිරිවැය විශ්වසනීය අයුරින් ගණනය කළ හැකිද යන්න තීරණය වන දුරට ආදායම හඳුනා ගැනේ. ආදායම හඳුනාගැනීමේ කාර්යය උදෙසා පහත සඳහන් විශේෂිත නිර්ණායක උපයෝගී කර ගැනේ.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
ගිණුම්කරණ ප්‍රතිපත්ති

අ) **පොලී ආදායම සහ වියදම්**

උපචිත පදනම සහ සඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම සහ වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හඳුනාගනු ලබයි. සඵලදායී පොලී අනුපාතය යනු මූල්‍ය වත්කම සහ වගකීමේ ඉදිරියට ගෙනා වටිනාකමට මූල්‍ය වත්කමේ හෝ වගකීමේ අපේක්ෂිත ජීව කාලය තුළින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් සහ ලැබීම් නියත ලෙස වට්ටම් කරනා අනුපාතයයි. (නැතිනම් අදාල වන පරිදි කෙටි කාලය) සඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී අරමුදල අනාගත ණය පාඩු නොව මූල්‍ය උපකරණවල සියළු ගිවිසුම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරයි.

මෙසේ සඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමට ගෙවන ලද හෝ ලැබුණ සියළු ගාස්තු සහ ලකුණු ඇතුලත් වන අතර ඒවා සඵලදායී පොලී අනුපාතයෙහි ඒකාබද්ධ කොටසක් වේ. ගණුදෙනු පිරිවැයට මූල්‍ය වත්කමක් හෝ වගකීමක් අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුව ආරෝපණය කළ හැකි වැඩිවන පිරිවැය ඇතුලත් වේ.

ආ) **වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනමින් ගිණුම් ගත කරනු ලබයි. මෙකී වෙනත් ආදායම් යන්නට දඩ සහ බේරුම් කරන ලද හානි හේතුවෙන් ලත් ආදායම් , ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය සහ අන් කවර හෝ මෙහෙයුම් නොවන ආදායම් ඇතුලත් විය.

2.8.13. වියදම් හඳුනාගැනීම

හටගත් පිරිවැය සහ විශේෂ ආදායම් අයිතමයන්හී ඉපයුම් අතර වන සෘජු සම්බන්ධතාව පදනම් කරගෙන වියදම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ව්‍යාපාර කටයුතු කරගෙන යාමෙන් සහ කාර්යක්ෂම අනුපාතයකින් දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙන් හටගන්නා වියදම් වසරේ ලාභ ලැබීමේදී ආදායමින් අයකර ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය උදෙසා කොමසාරිස්වරුන් දරන මතය වනුයේ වියදම් ක්‍රමවේදයෙහි ස්වභාවය මගින් අරමුදලේ කාර්යසාධනය සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලබන බවත් එහෙයින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අදාල කරගත් බවත්ය. වියදම සිදුවූ වසර තුළදී අලුත්වැඩියා සහ අලුත් කිරීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ.

2.8.14. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති -7 (LKAS – 7), 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිලියෙල කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත.

අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ සාධාරණ අගය තුළ කැපී නොපෙනෙනා අවදානම් වෙනස්වීම් වලට යටත්වන මාස තුනට අඩු කල් පිරීම් සහිත කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීම පිණිස රඳවා ගනු ලබනා ඉහල ද්‍රවශීලතාවකින් යුත් මූල්‍ය වත්කම් යනාදියෙන් මුදල් සහ මුදල සමාන දෑ සමන්විත වේ.

2.8.15. අදාල පාර්ශව අනාවරණයන්

අදාල පාර්ශව සමග ගණුදෙනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ පවත්වාගෙන යනු ලැබේ.

2.8.16. බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

සියළු දැන සිටින වගකීම් ප්‍රමාණයන් තීරණය කිරීමේදී අවබෝධ කරගත හැකි සියළු අවදානම් සැලකිල්ලට ගනු ලැබේ. අසම්භාව්‍ය බැරකම් යනු ඇතිවිය හැකි බැරකම් වන අතර ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම කළ නොහැකි හෝ විශ්වසනීය ලෙස මැණිය නොහැකි විටදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් මගින් පමණක් ඒවායේ පැවැත්ම තහවුරු කෙරේ. අසම්භාව්‍ය බැරකම් මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි හඳුනා නොගන්නා නමුදු ඒවා දුරස්ථ නොවේ නම් අනාවරණය කෙරේ.